2022.11.03 මහා සභා වාර්තාව

<u>පාණදුර නගර සභාව</u>

දිනය : 2022.11.03

වෙලාව : පෙ.ව. 10.00

ස්ථානය : නගර සභා රැස්වීම් ශාලාව

<u>සහභාගී වීම:</u>

ගරු සභාපති - එම්.ඩී.නන්දන ගුණතිලක මහතා

ගරු උපසභාපති - පී.එච්.විල්මන් මහතා

ගරු නාගරික මන්ත්‍රී - රජීව සංජය වීරමන් මහතා

ගරු නාගරික මන්ත්‍රී - අයි.ජානක උදයවර්ණ සොයිසා වික්‍රමසිංහ මහතා

ගරු නාගරික මන්ත්‍රී - විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා

ගරු නාගරික මන්ත්‍රී - එම්.පියසේන ප්‍රනාන්දු මහතා

ගරු නාගරික මන්ත්‍රී - කුමුදු ප්‍රනාන්දු මහතා

ගරු නාගරික මන්ත්‍රී - කමල්සිරි ප්‍රනාන්දු මහතා

ගරු නාගරික මන්ත්‍රී _ ලලීන් හසන්ත රුද්‍රිගෝ මහතා

ගරු නාගරික මන්ත්‍රී _ එච්.ඩී.මහින්ද පුන්සිරි මහතා

ගරු නාගරික මන්ත්‍රී _ පුෂ්පා ෆොන්සේකා මිය

ගරු නාගරික මන්ත්‍රී _ එච්.චන්දිම ඒ.පීරිස් මහතා

ගරු නාගරික මන්ත්‍රී _ ගයා උදයංගනී ද සිල්වා මිය

ගරු නාගරික මන්ත්‍රී _ ආර්.බන්දුල සොයිසා මහතා

ලේකම් _ ටී.මානෙල් සියඹලාගොඩ මෙය

සභාව පිළිගැනීම හා ආගම සිහි කිරීම

ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීමෙන් හා ආගම සිහිකිරීමෙන් පසුව මහා සභා රැස්වීමේ වැඩ කටයුතු පෙරවරු 10.00 ට ආරම්භ කරන ලදී.

2022.11.03 මහා සභා වාර්තාව

(අ) පසුගිය සභාවේ රැස්වීම් වාර්තා සම්මත කිරීම -

(අ.1) 2022.10.11 මහා සභා වාර්තාව

(අ.1.1) <u>ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා</u>

(අ.1.1.1) යෝජනා අංක ඊ.1.12 යටතේ ඉදිරිපත් කරන ලද 2023 වර්ෂය සඳහා පොදු උපයෝගී සේවා, සුභ සාධක සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේදී අය කර ගත යුතු ගාස්තු පැනවීම යටතේ අනු අංක 32 හී ආදාහනාගාර ගාස්තු (විතකය) ලෙස සඳහන් වන අතර එය ආදාහන ගාස්තු (විතකය) ලෙස සංශෝධනය කළ යුතු බව පවසා සිටින ලදී.

<u>සංශෝධන 01</u>

32. ආදාහන ගාස්තු (විතකය)

- නගර සභා සීමාව තුල	රු 600.00
- නගර සභා සීමාවෙන් පිටත	රු 850.00

(අ.1.2)<u>ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා</u>

(අ.1.2.1)පසුගිය සභා වාරයේ සංදේශ,පෙත්සම් ඉදිරිපත් කිරීම යටතේ අංක "ඇ.4" හී සඳහන් කර ඇති ලිපිය තමන් විසින් සභාව වෙත ඉදිරිපත් කළ අතර එය සඳහන්ව ඇත්තේ ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී යනුවෙන්.එමනිසා එය සංශෝධනය කරන ලෙස පවසා සිටින ලදී.

<u>සංශෝධන 02</u>

පාණදුර,උඩහමුල්ල,සිරිල් ජෑන්ස් මාවත,නො.142 හී පදිංචි පී.සුමිත් ප්‍රනාන්දු යන අය විසින් වැසි ජලය බැසයාමට ඇති අවහිරතාවයක් නිසා සිදුවන්නාවූ අපහසුතාව සම්බන්ධයෙන් ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා මඟින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

(අ.1.3)<u>ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා</u>

(අ.1.3.1) පසුගිය සභා වාර්තාවේ ගණකාධිකාරීතුමාගේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම හා අදාළ දීමනා සභා අරමුදලෙන් ගෙවීම සම්බන්ධ වූ යෝජනා අංක ඊ.1.20 පිළිබඳව තමන් විසින් යම් පැහැදිලි කිරීමක් සභාව වෙතින් ලබාගත් අතර ඒ පිළිබඳව කිසිදු සටහනක් සභා වාර්තාවේ නොමැති බැවින් එම අදහස් ප්‍රකාශ කිරීම සංක්ෂිප්ත වශයෙන් හෝ ඇතුළත් කරන ලෙස පවසා සිටින ලදී.

<u>සංශෝධන 03</u>

යෝජනා අංක ඊ.1.20 පිළිබඳව ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතාගේ අදහස් ප්‍රකාශ කිරීම

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා</u>

ගණකාධිකාරීතුමා වෙත මේවන විට සභා අරමුදලින් ගෙවනු ලබන දීමනාව ,සභා අරමුදලින් දැරූ පසු එම මුදල් ,වෙනත් වැටුප් සඳහා ගෙවන මුදල් ප්‍රතිපූර්ණය වෙන ආකාරයෙන්ම ප්‍රතිපූර්ණය වෙනවාද දීමනා වශයෙන් මාසිකව කොපමණ මුදලක් ගෙවනවාද යන්න විමසා සිටින ලදී.

ගරු සභාපතිතුමා

ගණකාධිකාරීතුමා වෙත මාසිකව ලක්ෂයක පමණ දීමනාවක් සහා අරමුදලින් ගෙවනු ලබනවා.මෙහිදී සභාවේ ගණකාධිකාරී තනතුර සඳහා පුරප්පාඩුවක් පවතින අතර සභාව වෙත වැටුප් ප්‍රතිපූර්ණය වීමේදී එම පුරප්පාඩු තනතුර සඳහා ද වැටුප් ප්‍රතිපූර්ණය වීම සිදු වෙනවා.එම ප්‍රතිපූර්ණය වන මුදලින් ගණකාධිකාරීතුමා වෙත ගෙවනු ලබන දීමනාව ආවරණය වීමක් සිදුවන බව පවසා සිටින ලදී.

2022.10.11 වන දින මහා සභා වාර්තාව,ඉහත සංශෝධන වලට යටත්ව පිළිගැනීම සුදුසු බව ගරු සභාපති එම්.ඩී.නන්දන ගුණතිලක මහතා විසින් යෝජනා කල අතර ,ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා විසින් ස්ථිර කරන ලදුව 2022.10.11 වන දින මහා සභා වාර්තාව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදන - නැත

(ඇ) නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා -

(ඇ.1) ගරු නාගරික මන්ත්‍රී කේ.ඩී.අශෝකා රත්නමාලි මිය, මෙදින මහා සභා වාරය වෙත නොපැමිණෙන බව දන්වා ඇති අතර මෙම සභික මහත්මියට නිවාඩු අනුමත කිරීමට ගරු සභාපති නන්දන ගුණතිලක මහතා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතාගේ ස්ථිරත්වයෙන් හා සියළුම සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් ඒකමතිකව නිවාඩු අනුමත කරන ලදී.

(ඇ.2) ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය ,මෙදින මහා සභා වාරය වෙත නොපැමිණෙන බව දන්වා ඇති අතර මෙම සභික මහත්මියට නිවාඩු අනුමත කිරීමට ගරු සභාපති නන්දන ගුණතිලක මහතා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතාගේ ස්ථිරත්වයෙන් හා සියළුම සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් ඒකමතිකව නිවාඩු අනුමත කරන ලදී.

(ඇ.3) ගරු නාගරික මන්ත්‍රී එම්.පද්මසිරි සිල්වා මහතා ,මෙදින මහා සභා වාරය වෙත නොපැමිණෙන බව දන්වා ඇති අතර මෙම සභික මහතාට නිවාඩු අනුමත කිරීමට ගරු සභාපති නන්දන ගුණතිලක මහතා යෝජනා කරන ලදුව ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතාගේ ස්ථිරත්වයෙන් හා සියළුම සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් ඒකමතිකව නිවාඩු අනුමත කරන ලදී.

(ඈ) සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරීම -

(ඈ.1) පාණදුර,සාගර මාවත,නො.56/3 යන ලිපිනයේ පදිංචි බී.බී.ඩී.පෙරේරා යන අය විසින් ඔවුන්ගේ නිවස පිහිටි මාර්ගයේ ඇති වෙනත් නිවසක තාප්පය ඉදිකර මාර්ගයේ විදුලි රැහැන් කණු එම ඉඩම තුළ පැවතීම හේතුවෙන් ඇති වී ඇති ගැටළු සම්බන්ධයෙන් ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා හරහා ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

(ඉ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

(ඊ) යථා පරිදි කල් දී ඇති යෝජනා

(ඊ.1) ගරු සභාපති නන්දන ගුණතිලක මැතිතුමා, ඉදිරිපත් කරන ලද යෝජනා

(ඊ.1.1)කොට්ඨාශ අංක 01,ධම්මානන්ද මාවතේ ,වරිපනම් අංක 26 දරණ ස්ථානය සරණපාලාරාම විහාරස්ථානයට අයත්වන අතර එහි පවත්වාගෙන යන මරණාධාර සමිතිය පුණ්‍ය කටයුතු සඳහා වන ආයතනයක් වේ.2019 වර්ෂයේ තෙක් වරිපනම් බදු නිදහස් ආයතනයක් ලෙස පැවතියද නැවත 2020 වර්ෂයේ නව තක්සේරුව මඟින් වාණිජ දේපලක් ලෙස ගණනය වී ඇත. මෙකී දේපළ පුණ්‍ය කටයුතු සිදු කරන ස්ථානයක් බැවින් වරිපනම් බදු නිදහස් කිරීමටත් හිඟ වරිපනම් බදු මුදලවන රු 11,547.20 ක වරිපනම් බදු මුදල කපා හැරීමටත් මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතරකොට්ඨාශ අංක 01,ධම්මානන්ද මාවතේ ,වරිපනම් අංක 26 දරණ ස්ථානය සරණපාලාරාම විහාරස්ථානයට අයත්වන අතර එහි පවත්වාගෙන යන මරණාධාර සමිතිය,පුණ්‍ය කටයුතු සඳහා වන ආයතනයක් බැවින් එකී දේපළ හී වරිපනම් බදු නිදහස් කිරීමටත් හිඟ වරිපනම් බදු මුදලවන රු 11,547.20 ක වරිපනම් බදු මුදල කපා හැරීමටත් තීරණය විය.

(ඊ.1.2) 2023 වර්ෂය සඳහා පාණදුර නගර සභාවට අයත් ස්ථානයන්හී පොල් හා තැඹිලි ඵලදාව බදු දීම සඳහා පහත පරිදි ලංසු අයදුම්පත් කැඳවීමට හා පහත වගුවේ සඳහන් පරිදි අවම ලංසු මුදලත්,ආපසු නොගෙවන ලංසු පෝරම ගාස්තු හා ආපසු ගෙවන ලංසු තැන්පත් මුදල අයකිරීමටත් ලංසු කැඳවීම ප්‍රාදේශීය වශයෙන් සිදුකිරීමටත් මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

ස්ථානය	තැඹිලි ගස් සංඛ්‍යාව	පොල් ගස් සංඛ්‍යාව	ආපසු නොගෙවන ලංසු පෝරම ගාස්තු (රු)	ආපසු ගෙවන ලංසු තැන්පතුව (රු)	වාර්ෂික අවම ලංසුව
වෙරළ පරිශ්‍රය	03	33			
පිහිණුම් තටාක පරිශ්‍රය	04	05			
පුස්තකාලය	04	02			
වැඩ අංගනය	01	01	1,500.00	2,500.00	35,000.00
සුමනධීර මාවත ඉඩම	–	05			
මුළු ගස් සංඛ්‍යාව	12	46			

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා</u>

මෙම ස්ථාන සියල්ලම එකට ටෙන්ඩර් කිරීමේදී අදාළ ටෙන්ඩර්කරුට එම ස්ථාන සියල්ලම බලා ගැනීමට අපහසුයි.එමනිසා පොල්ගස් වැඩි සංඛ්‍යාවක් පවතින වෙරළ පරිශ්‍රයේ පොල් ගස් වෙනම ටෙන්ඩර් කිරීමත් අනෙකුත් ස්ථාන කිහිපය එකට ගෙන වෙනම ටෙන්ඩර් කිරීමත් සුදුසු බව පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා</u>

පොල් හා තැඹිලි ගස් 58 ක් පවතිනවා.වාර්ෂික අවම ලංසුව රු 35000.00 ලෙස ගත්විට,පොල්ගස් පිළිබඳව පමණක් සලකා ගණනය කළහොත් සාමාන්‍යයෙන් මාසිකව රු 2916 ක් වැනි අගයක් තමා සභාවට ආදායම ලෙස පවතින්නේ.මේවන විට පොල් වල මිලගණන් ගත්විට වෙළඳ පොලේ පොල්ගෙඩියක් රු 120.00 ක් පමණ වෙනවා.වෙරළ පරිශ්‍රයේ පොල්ගස්වල පොල් ඵලදාවද සැලකිය යුතු මට්ටමක පවතිනවා.එමනිසා මෙම කාර්යය විධිමත් කිරීම සම්බන්ධයෙන් යෝජනාවට එකඟ වන අතරම වාර්ෂික අවම ලංසුව යම් සංශෝධනයක් කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

මෙම ඵලදාව නියමිත පරිදි සභාවට ලබා ගැනීමට නොහැකි වුණා.අවස්ථා 02 කදී පමණ මෙම ගස්වල ඵලදාව ලබාගනිමින් සාධාරණ මුදලකට සභා සේවකයින් වෙත ලබාදුන්නා.එයින් එක් අවස්ථාවකදී රු 6000.00 ක් සභා ආදායමට ලැබී තිබෙනවා. එමනිසයි ආරම්භයක් වශයෙන් මෙම යෝජනාව අද දින ඉදිරිපත් කරන්නේ.ඉදිරිපත් වූ අදහස් ගත්විට උපසභාපතිතුමා පවසා සිටි ආකාරයට කොටස් 02 ක් ලෙස ටෙන්ඩර් කළහොත් වෙරළ පරිශ්‍රය හැර අනෙකුත් ස්ථානවල ටෙන්ඩරය ලබාගැනීම ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් නොවී සිටිය හැකියි.චන්දිම මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ අදහස සුදුසුයි,නමුදු මුල් අවස්ථාව බැවින් මෙම අවම ලංසුව මුදලට ලබාදී ටෙන්ඩරය යම් කිසිවෙකු ලබාගත හොත් ඔවුන් පොල් ඵලදාව ලබාගන්නා අවස්ථාවේදී සභාවේ ආදායම් පරීක්ෂක මහතුන් එය නිරීක්ෂණය කර ලැබෙන්නාවූ ආදායම පිළිබඳ යම් තහවුරුවක් ලබාගෙන ඒ මත පදනම්ව ඉදිරි වර්ෂයේදී මිල සංශෝධනයකට යොමු වීම සුදුසු බව පවසා සිටින ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර2023 වර්ෂය සඳහා පාණදුර නගර සභාවට අයත් පහත ස්ථානයන්හී පොල් හා තැඹිලි ඵලදාව බදු දීමත්අදාළ ලංසු කැඳවීම ප්‍රාදේශීය වශයෙන් සිදුකිරීමටත් පහත වගුවේ සඳහන් පරිදි අවම ලංසු මුදලත්,ආපසු නොගෙවන ලංසු පෝරම ගාස්තු හා ආපසු ගෙවන ලංසු තැන්පත් මුදල අයකිරීමටත් තීරණය විය.

ස්ථානය	තැඹිලි ගස් සංඛ්‍යාව	පොල් ගස් සංඛ්‍යාව	ආපසු නොගෙවන ලංසු පෝරම ගාස්තු (රු)	ආපසු ගෙවන ලංසු තැන්පතුව (රු)	වාර්ෂික අවම ලංසුව
වෙරළ පරිශ්‍රය	03	33	1,500.00	2,500.00	35,000.00
පිහිණුම් තටාක පරිශ්‍රය	04	05			
පුස්තකාලය	04	02			
වැඩ අංගනය	01	01			
සුමනධීර මාවත ඉඩම	–	05			
මුළු ගස් සංඛ්‍යාව	12	46			

(ඊ.1.3) පාණදුර නගර සභාවේ ආරක්ෂක සේවය සැපයීම සඳහා,බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය යටතේ ආරම්භ කර ඇති වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය සමඟ 2022 වර්ෂය සඳහා ගිවිසුම්ගත කාලය 2022.12.31 දිනෙන් අවසන් වේ.2023.01.01 දින සිට 2023.12.31 දක්වා කාලයට ආරක්ෂක සේවය සැපයීම සඳහා නැවතත් එම ආයතනය සමඟ ගිවිසුම්ගත වීමටත්,පහත සඳහන් ඇස්තමේන්තුවට අනුව සභා අරමුදලින් ආරක්ෂක නිළධාරීන් 06 දෙනෙකු සඳහා දීමනා ගෙවීමටත් මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

තනතුර	නිලධාරීන් ගණන	දිනකට වියදම එක් මුරයක් සඳහා (රු)	වසරක වියදම (රු)	
ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිළධාරී	01	1567.00	(1567.00 X 30 X 12 X 1)	564,120.00
කණිෂ්ඨ ආරක්ෂක නිළධාරී	05	1517.00	(1517.00 X 30 X 12 X 5)	2,730,600.00
				3,294,720.00

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු සභාපතිතුමා</u>

මේවන විට සභාවේ පුරප්පාඩු සැලකිය යුතු ප්‍රමාණයක් පවතිනවා.සියළු බඳවා ගැනීම් මේවන විට නතර කිරීම තිබීම හේතුවෙන් එම පුරප්පාඩු සම්පූර්ණ කර ගත නොහැකි වී තිබෙනවා. බහු කාර්යය සංවර්ධන සහයකින් සභාව වෙත යොමුකළද එයින් සැලකිය යුතු සංඛ්‍යාවක් සේවය හැරගොස් පවතිනවා.එමෙන්ම එම බහු කාර්යය සංවර්ධන සහයකයින්ගෙන් අපේක්ෂිත සේවයද සභාවන් වෙත ලබාගැනීමට නොහැකි වී තිබෙනවා.මෙම ආරක්ෂක සේවාව ලබාගැනීමට සිදුවී තිබෙන්නේත් මුර සේවකයින්ගේ පවතින හිඟතාවය මත බව පවසා සිටින ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතරපාණදුර නගර සභාවේ ආරක්ෂක සේවය සැපයීම සඳහා,බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය යටතේ ආරම්භ කර ඇති වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය සමඟ 2023.01.01 දින සිට 2023.12.31 දක්වා වූ කාලයට නැවතත් ගිවිසුම්ගත වීමටත්,පහත සඳහන් ඇස්තමේන්තුවට අනුව සභා අරමුදලින් ආරක්ෂක නිළධාරීන් 06 දෙනෙකු සඳහා දීමනා ගෙවීමටත් තීරණය විය.

තනතුර	නිලධාරීන් ගණන	දිනකට වියදම එක් මුරයක් සඳහා (රු)	වසරක වියදම (රු)	
ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිළධාරී	01	1567.00	(1567.00 X 30 X 12 X 1)	564,120.00
කණිෂ්ඨ ආරක්ෂක නිළධාරී	05	1517.00	(1517.00 X 30 X 12 X 5)	2,730,600.00
				3,294,720.00

(ඊ.1.4) රා.ප.ච.02/2018 ට අනුව,සෑම සේවකයෙකුටම පැය 12 ක පුහුණු අවස්ථාවක් ලබාදීම සිදුකළ යුතු බැවින්,පාණදුර නගර සභාවේ කාර්ය මණ්ඩලය හට රාජකාරී කටයුතු තෘප්තිමත්ව පවත්වාගෙන යාම සඳහා,ඒකාකාරී බවින් මිදී මානසික සුවය ඇතිකරලීමට සුදුසු වැඩසටහනක් කණ්ඩායම් 02 ක් ලෙස අවස්ථා දෙකකදී පැවැත්වීමට සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතරරා.ප.ච.02/2018 ට අනුව,සෑම සේවකයෙකුටම පැය 12 ක පුහුණු අවස්ථාවක් ලබාදීම සිදුකළ යුතු බැවින්,පාණදුර නගර සභාවේ කාර්ය මණ්ඩලය හට රාජකාරී කටයුතු තෘප්තිමත්ව පවත්වාගෙන යාම හා ඒකාකාරී බවින් මිදී මානසික සුවය ඇතිකරලීමට සුදුසු වැඩසටහනක් කණ්ඩායම් 02 ක් ලෙස අවස්ථා දෙකකදී පැවැත්වීමට තීරණය විය.

(ඊ.1.5) 2022 ඔක්තෝබර් මස කමිටු වාර්තා අනුමැතිය සඳහා මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

(ඊ.1.5.1) 2022.10.07 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

ඒ අනුව 2022.10.07 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ ඇතුළත් වාර්තාව පහත පරිදි වේ.

පාණදුර නගර සභාව

කර්මාන්ත හා නගර සභා දේපළ සංරක්ෂණ කමිටු වාර්තාව

දිනය : - 2022.10.07

වේලාව : - පෙ.ව. 10.00

ස්ථානය : - පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයින්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත
2	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	ඇත
3	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
4	ගරු නාගරික මන්ත්‍රී	විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා	ඇත
5	ගරු නාගරික මන්ත්‍රී	එම්. පියසේන ප්‍රනාන්දු මහතා	ඇත
6	ගරු නාගරික මන්ත්‍රී	ලලීන් හසන්ත රුදිගෝ මහතා	ඇත

7	ගරු නාගරික මන්ත්‍රී	මහින්ද පුන්සිරි මහතා	ඇත
8	ගරු නාගරික මන්ත්‍රී	ආර්. බන්දුල සොයිසා මහතා	ඇත
9	ගරු නාගරික මන්ත්‍රී	ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මිය	ඇත

සහභාගී වූ වෙනත් නිළධාරීන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
2	වැඩ අධිකාරී	කේ.පී.මායාරත්න මහතා	ඇත
3	තාක්ෂණ නිළධාරී	එස්.ඩී.ආර්. තුෂාරා මිය	ඇත
4	තාක්ෂණ නිළධාරී	ප්‍රසාදි විජේරත්න මිය	ඇත
5	තාක්ෂණ නිළධාරී	ජයන්ත ඇල්පිටිය මහතා	ඇත
6	අංශ ප්‍රධානී (කර්මාන්ත)	තමිලා විජයසිංහ මිය	ඇත
7	සංවර්ධන නිළධාරී(නීති)	ඉමල්කා වේරගම මිය	ඇත

01. PUC/5/4/1/23/2022පාණදුර නගරශාලාවේ වහල අලුත්වැඩියා ලිපි ගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් සකස් කරන ලද රු 1,995,485.17 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 1,995,485.17 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.මෙහිදී වහල අලුත්වැඩියා කිරීමෙන් පසු ඒ ඔස්සේ පිටත ශබ්දය, ශාලාව තුළට නොපැමිණෙන ලෙස සුදුසු පරිදි සකස් කිරීමට ඇස්තමේන්තු සකස් කරන ලෙසද කර්මාන්ත කමිටුව නිර්දේශ කරන ලදී.

02. PUC/05/03/02-03/2020 භූගත ඉන්ධන ටැංකිය මිලදී ගැනීම ලිපිගොනුවට අනුව අසිත ඉංජිනියරින් එන්ටර්ප්‍රයිසස් ආයතනය මඟින් භූගත ඉන්ධන ටැංකිය මිලදී ගැනීමට අදාලව එම ආයතනය වෙත ගෙවිය යුතු රු 2,190,000.00 ක මුදල එම ආයතනය වෙත ගෙවීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 2,190,000.00 ක මුදල, අසිත ඉංජිනියරින් එන්ටර්ප්‍රයිසස් ආයතනය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

03. PUC/5/4/1/23/2022 පාණදුර නගරශාලා ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම (ජනෙල්,උළුවහු) ගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් සකස් කරන ලද රු 1,589,252.08 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී..

රු 1,589,252.08 ක ඇස්තමේන්තුව,කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

04. <u>සාකච්ඡා කරන ලද වෙනත් කරුණු</u>

4.1 PUC/5/4/1/21/2021 කසල අංගනය යාබද නව රථ ගාලෙහි වැසිකිළිය අලුත්වැඩියා කිරීම ලිපි ගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් සකස් කරන ලද රු 325,644.69 ක සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 325,644.69 ක සංශෝධිත ඇස්තමේන්තුව,කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

4.2 PUC/5/4/1/25පාණදුර නගර සභාවේ වාහන සේවා ස්ථානයක් ඉදිකිරීම ලිපිගොනුවට අනුව එකී කර්මාන්තය ඉටු කිරීම වෙනුවෙන් සකසන ලද රු 2,200,000.00 ක් වන ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 2,200,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

4.3PUC/5/4/1/13-2022 ඉන්ධන ටැංකිය බහාලීම සඳහා කොන්ක්‍රීට් ටැංකියක් ඉදිකිරීම ලිපිගොනුවට අනුව එම ව්‍යාපෘතියේ අවසන් ගෙවීම් වාර්තාව වන රු 1,110,697.71 ක මුදල අනුමැතියටත් පළමු ගෙවීම වන රු 831,167.34 ක මුදල හා 10% අතරුඳවුම් මුදල වන රු 111,069.77 ක මුදල අඩුකර ඉතිරි මුදල වන රු 168,460.60 ක මුදල ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය වෙත ගෙවීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

අවසන් ගෙවීම් වාර්තාව අනුව මුළු ගෙවීම් මුදල වන රු 1,110,697.71 ක මුදල හා පළමු ගෙවීම වන රු 831,167.34 ක මුදල හා 10% අතරුඳවුම් මුදල වන රු 111,069.77 ක මුදල අඩුකර ඉතිරි මුදල වන රු 168,460.60 ක මුදල ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

4.4 PUC/5/4/3/35/2020 ප්‍රධාන පුස්තකාලයේ වැසිකිළිය සකස් කිරීම ලිපිගොනුවට අනුව මෙම කර්මාන්තයේ ගිවිසුම් කාලය 2022.12.01 දින දක්වා පවතී.කර්මාන්තය 60% ක් පමණ නිම වී ඇත.ඇස්තමේන්තුවේ අයිතම අංක 1 සිට 34 දක්වා වූ වැඩ විෂයන්ගෙන් අංක 14,17,18,23,25 හා 28 යන විෂයන් පමණක් මිල ගණන් සංශෝධන යටතේ ගැලපීමට කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.(වහලයට දැව දඬු හා ඇස්බැස්ටෝස් ෂීට් වෙනුවට සභාවේ පවතින භාවිත තහඩු -Zink Aluminiumයොදා ගැනීම මත ප්‍රතිපාදන ඉතිරියක්ද සිදුව ඇත.)

ඇස්තමේන්තුවේ අයිතම අංක 1 සිට 34 දක්වා වූ වැඩ විෂයන්ගෙන් අංක 14,17,18,23,25 හා 28 යන විෂයන් පමණක් මිල ගණන් සංශෝධන යටතේ ගැලපීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4.5 සභාව සතු ශ්‍රම සම්පත කළමනාකරණය කර ගැනීම සඳහා සභාවට අයත් වීදි ලාම්පු දැල්වීම සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස නගර සභා බල ප්‍රදේශයේ නගර මධ්‍යයේ තෝරා ගත් කොටස් 10 ක් සඳහා Auto operated Lamp Sensors 20 ක් මිලදී ගත යුතු බව 2022.07.07 මහා සභාව මඟින් තීරණය විය.පළාත් පාලන ආයතන වල සවි කිරීමට අනුමැතිය ලත් ලක්ෂානි ඉලෙක්ට්‍රොනික්ආයතනයෙන් ලබාදුන් මිල ගණන් අනුව වැඩ අධිකාරීතුමාගේ නිර්දේශ යටතේ ඉහත සඳහන් 30A උපාංග 10 ක් රු 26,650.00 බැගින් රු 266,500.00 ක මුදලකට හා 6A උපාංග 10 ක් රු 1550.00 බැගින් රු 15500.00 ක මුදලකටත් අදාල ආයතනයෙන් මිලදී ගැනීමට කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරමි.

30A Auto operated Lamp Sensors 10 ක් රු 26,650.00 බැගින් රු 266,500.00 ක මුදලකට හා 6A Auto operated Lamp Sensors 10 ක් රු 1550.00 බැගින් රු 15500.00 ක මුදලකට , ලක්ෂානි ඉලෙක්ට්‍රොනික්ආයතනයෙන් මිලදී ගැනීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

4.6 PUC/5/4/1/24/2022 පාණදුර ජයතිලක මාවතේ ඉහළ කොටසේ කාණු පද්ධතියට කොන්ක්‍රීට් ලෑලි දමා සංවර්ධනය කිරීම ලිපිගොනුවට අනුව,එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් සකසන ලද රු 2,384,612.15 ක් වූ ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 2,384,612.15 ක් වූ ඇස්තමේන්තුව, කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

4.7 PUC/5/4/1/3-2022 වායු සමීකරණ යන්ත්‍ර සේවා කිරීම ලිපිගොනුවට අනුව,ලේකම්තුමියගේ කාමරයේ සවිකර ඇති වායු සමීකරණ යන්ත්‍රය අක්‍රිය වීම හේතුවෙන් එය අලුත්වැඩියා කිරීම සඳහා MAIND & TECH

ආයතනය (2022.08.24 දින ටෙන්ඩර් කමිටුවේදී තෝරා ගන්නා ලද ආයතනය) විසින් එවා ඇති රු 23,500.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 23,500.00 ක ඇස්තමේන්තුව,කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

4.8 PUC/5/4/1/14-2021 ඕබට් සිල්වා කියවීම් ශාලාව හා පරණ මස්ටරය පැවැත්වූ ගොඩනැගිල්ලේ අලුත්වැඩියාව ලිපිගොනුවට අනුව එම ව්‍යාපෘතියේ සංශෝධිත ඇස්තමේන්තුවට අනුව,වහල ගැසීම සඳහා මුළු මුදල ලෙස රු 218,024.76 ක මුදලක් වෙන්ව ඇත.එම කර්මාන්තය ඉටු කිරීම වෙනුවෙන් සභාවෙන් ලබාදෙන අයිතම ලෙස ඉදිරිපත් කර ඇති දැව හා ඇස්බැස්ටස් සඳහා වියදමද වහලයේ අගුව තවදුරටත් දිගු විය යුතු බැවින් ඒ සඳහා වියදමද ඇතුළත්ව රු 543,700.00 ක මුදලක් වැයවන බව වැඩ අධිකාරී වාර්තා කර ඇත. ඒ සම්බන්ධව කර්මාන්ත කමිටුවේ සාකච්ඡා කර තීරණයක් ගැනීමට හා අමතර ප්‍රතිපාදන වෙන් කිරීමට කර්මාන්ත කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 543,700.00 ක මුදල වැයකරමින් අදාළ ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට කටයුතු කිරීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

4.9 මෙවන විට ව්‍යාපෘති ආරම්භ කර, යම් යම් හේතුන් මත අතරමඟ වැඩ කටයුතු නතර කර ඇති සභාවට අයත් ගොඩනැගිලි වල ලැයිස්තුවක් හා ඒවාහි සංවර්ධන කටයුතු මෙවන විට නතර වී ඇති හේතුන් මොනවාද යන්න වාර්තාවක් සමඟ මීළඟ කර්මාන්ත කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර2022.10.07 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ ,අනුමත කිරීමට තීරණය කරන ලදී.

(ඊ.1.5.2)2022.10.13 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

ඒ අනුව 2022.10.13 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටු නිර්දේශ ඇතුළත් වාර්තාව පහත පරිදි වේ.

<u>පාණදුර නගර සභාව</u>

<u>සෞඛ්‍ය,පරිසර හා ආපදා කළමනාකරණ කමිටු වාර්තාව</u>

දිනය : - 2022.10.13

වේලාව : - පෙ.ව. 09.30

ස්ථානය : - පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

<u>කමිටු සාමාජිකයින්</u>

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත

2	ගරු උපසභාපති	පී.එච්.විල්මන් මහතා	ඇත
3	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	ඇත
4	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
5	ගරු නාගරික මන්ත්‍රී	කේ.ඩී.අශෝකා රත්නමාලි මිය	ඇත
6	ගරු නාගරික මන්ත්‍රී	කුමුදු ප්‍රනාන්දු මහතා	ඇත
7	ගරු නාගරික මන්ත්‍රී	පුෂ්පා ෆොන්සේකා මිය	ඇත
8	ගරු නාගරික මන්ත්‍රී	එච්.චන්දිම ඒ.පීරිස් මහතා	ඇත
9	ගරු නාගරික මන්ත්‍රී	ගයා උදයංගනී ද සිල්වා මිය	නැත

සහභාගී වූ වෙනත් නිළධාරීන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
2	වැඩ අධිකාරී	කේ.පී.මායාරත්න මහතා	ඇත
3	මහජන සෞඛ්‍ය පරීක්ෂක	සම්පත් මොරමුදලි මහතා	ඇත
4	අංශ ප්‍රධානී (සෞඛ්‍ය)	එච්.ටී.හෙට්ටිආරච්චි මිය	ඇත
5	ප්‍රජා සංවර්ධන නිළධාරී වෙනුවට	උපුල් විරාජ් මහතා	ඇත
6	සෞඛ්‍ය පරිපාලක	ආර්.ආර්.ඒ. වික්‍රමසිංහ මහතා	ඇත
7	සෞඛ්‍ය උපපරිපාලක	සුජීව පුෂ්පකුමාර මහතා	ඇත
8	සෞඛ්‍ය උපපරිපාලක	බී.නිමල්සිරි පෙරේරා මහතා	ඇත
9	සෞඛ්‍ය උපපරිපාලක	කේ.ජී.එම්.සුසිත චාමර මහතා	ඇත

අසනීප තත්ත්වයක් හේතුවෙන් අද දින කමිටුව වෙත සහභාගී විය නොහැකි බව ගරු නාගරික මන්ත්‍රී ගයා උදයංගනී ද සිල්වා මිය විසින් දුරකථනය ඔස්සේ දන්වා සිටිබව ලේකම්තුමිය විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව කමිටුවේ සියළු සභිකයින්ගේ එකඟත්වය මත ඇය වෙත නිවාඩු අනුමත කරන ලදී.

01. ව්‍යාපෘති පදනම මත සේවයට බඳවා ගත් පී.මධුසංක මයා 2022 මැයි මස සිට මේ දක්වා සේවයට වාර්තා කර නොමැති අතර ඒ වෙනුවට වෙනත් සේවකයෙකු ලබා ගැනීම සඳහා සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

ඩෙංගු ව්‍යාපෘතිය සඳහා අනුමත වී ඇති සේවක සංඛ්‍යාව යටතේ පවත්නාවූ පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

02. මිනුවම්පිටිය සුසාන භූමියේ අළු බඳුන් තැන්පත් කරන මල් පෝච්චි පෙරලී කැඩී බිඳී යන බැවින් ඒ සඳහා වෙනත් සුදුසු ස්ථානයක් එම බඳුන් තැන්පත් කිරීම සුදුසු බවට යෝජනා කරන අතර සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

මිනුවම්පිටිය සුසාන භූමියේ ගේට්ටුවෙන් ඇතුළු වී දකුණු පස කැලේ වැවී ඇති සොහොන් කොත් නොමැති ස්ථානයක් සුදුසු පරිදි සකස් කර බඳුන් තැන්පත් කිරීම සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

03. නිරන්තරයෙන් වෙනස් වනු ලබන මිල ගණන් හේතුවෙන් ඝණ අපද්‍රව්‍ය සඳහා ටෙන්ඩර් කැඳවමින් ලබාදීම සභාවට අවාසි වන බව දක්නට ලැබේ.එබැවින් 2023 වසරේ ඝණ අපද්‍රව්‍ය ගැණුම්කරුවන් සොයා ගනිමින් වෙළඳපොළෙහි අද පවතින වැඩිම මිලට විකිණීම සඳහා සාකච්ඡා කර තීරණයක් ගැනීම සඳහා සෞඛ්‍ය කමිටුවට ඉදිරිපත් කරන ලදී.

සණ අපද්‍රව්‍ය විකිණීමෙන් මෙම වසරේ ජනවාරි සිට ඔක්තෝබර් 07 දක්වා පහත පරිදි ආදායමක් සභාව වෙත ලැබී ඇති බව මහජන සෞඛ්‍ය පරීක්ෂක සම්පත් මොරමුදලි මහතා විසින් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

මාසය	සුදු වීදුරු විකිණීමෙන් ලද ආදායම (රු)	බියර් ටින් විකිණීමෙන් ලද ආදායම (රු)	පෙට් බෝතල් විකිණීමෙන් ලද ආදායම(රු)	මුළු ආදායම (රු)
ජනවාරි	_	_	_	_
පෙබරවාරි	_	_	_	_
මාර්තු	_	_	_	_
අප්‍රේල්	_	61,040.00	_	61,040.00
මැයි	155,220.00			155,220.00
ජූනි	_	_	_	_
ජූලි	_	_	_	_
අගෝස්තු	_	_	_	_
සැප්තැම්බර්	42,050.00	_	_	42,050.00
ඔක්තෝබර් 01 සිට 07 දක්වා	_	74,700.00	44,880.00	119,580.00
එකතුව	197,270.00	135,740.00	44,880.00	377,890.00

ඒ අනුව මේවන විට වෙළඳ පොළ පවතින මිල ගණන් වරින් වර උච්චාවචනය වන බැවින් ටෙන්ඩර් කැඳවීමකින් තොරව 2023 වසරේ සණ අපද්‍රව්‍ය ගැණුම්කරුවන් සොයා ගනිමින් වෙළඳපොළෙහි පවතින වැඩිම මිලට විකිණීම සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

04. පිහිණුම් තටාකයේ ජල පෙරහන් (ෆිල්ටර්ස්) ඇතුළුව අළුත්වැඩියා කටයුතු කිහිපයක් සිදුකිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත.එබැවින් ඒ සඳහා පිහිණුම් තටාකය දින 02 ක් හෝ 03 ක කාලයක්,අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට සඳහා වසා තැබීමට සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

පුහුණුකරුවන් හා පිහිණුම් තටාකය වෙත පැමිණෙන ජනතාව පූර්වයෙන් දැනුවත් කරමින් පිහිණුම් තටාකය අළුත්වැඩියා කිරීම සඳහා වසා දැමීම සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කළ අතර මෙහිදී ගැඹුර සලකුණු කිරීම ඇතුළු සියළු අළුත්වැඩියාවන් සිදු කර අවසන් කරන ලෙසද සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

05. <u>සාකච්ඡා කරන ලද වෙනත් කරුණු</u>

5.1 රට තුළ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් දරුවන් මුහුණ දෙමින් පවතින මන්දපෝෂණ තත්ත්වය හේතුවෙන් දරුවන්ගේ බර මට්ටම් අඩු වෙමින් පවතින බව වාර්තා අධ්‍යනය කිරීමෙන් පෙනී යන බැවින් අප නගර සභාව සතු සියලු පෙර පාසල් දරුවන්ගේ පෝෂ්‍යදායී ආහාර අවශ්‍යතාව පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීම සඳහා සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

පෝෂ්‍යදායී ආහාර අවශ්‍යතාව පිළිබඳව දෙමාපියන් දැනුවත් කළද රටෙහි පවතින ආර්ථික අර්බුදය හමුවේ දරුවන් වෙත පෝෂ්‍යදායී ආහාර වේලාක් ලබාදීමේ ගැටළුවකට දෙමාපියන් මුහුණ දෙන බැවින් දැනුවත් කිරීමකට යොමු නොවී දරුවන් වෙත ආහාර ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.2 කසල අවසන් බැහැර කිරීම සඳහා GFC මැෂිනර් පුද්ගලික සමාගම වෙත යොමු කරන ලද කසල ලෝඩ් ගණන හා ඒ සඳහා ගෙවන ලද මුදල පිළිබඳ පහත වාර්තාව සෞඛ්‍ය කමිටුවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

මාසය	ලෝඩ් ගණන	ගෙවූ මුදල
ජනවාරි	47	1,339,500.00

පෙබරවාරි	43	1,225,500.00
මාර්තු	23	655,500.00
අප්‍රේල්	13	370,500.00
මැයි	14	399,000.00
ජූනි	36	1,242,000.00
ජූලි	22	759,000.00
අගෝස්තු	22	758,975.00
සැප්තැම්බර්	10	345,000.00
මුළු ගණන	230	7,094,975.00

කමිටුවේ අවධානය යොමු වන ලදී.

5.3 කසල අංගනයේ කසල තේරීම සඳහා සේවකයින් නොමැති බව හා කසල අංගනය තුළ කසල විසිරී පවතින බව ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව කසල තේරීම සඳහා ව්‍යාපෘති සේවකයින් යොදවා ඇති බැවින් එම සේවකයින් දිනපතා එම රාජකාරිය සඳහා යොදවන ලෙසත් දිනපතා කසල අංගනය අතුගා පිරිසිදුව පවත්වාගැනීමට කටයුතු කරන ලෙසත් සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.4 රේල් ගේට්ටුව ඉදිරිපිට කාණුවෙහි කසල රැදී පවතින බැවින් ඉහළින් ගලා එන ජලය ,එම කාණුව ඔස්සේ ගලා යෑමක් සිදු නොවන බව ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව එම කාණුව කඩිනමින් පිරිසිදු කිරීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.5 වෙරළෙහි වාහන නැවතුම් ස්ථානයේ පවතින පස් තුනී කර ඒ මත මුහුදු වැලි දමා නිසි ලෙස සකස් කළ හොත් එම ස්ථානයෙන් වැඩි ආදායමක් ලබාගත හැකි බව ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව JCB රථයක් මඟින් එම ස්ථානයේ පස්තුනී කර වෙරළෙන්ම මුහුදු වැලි ගෙන දමා බිම සකස් කිරීම සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.6 සභාව සතු වාහන වල සිග්නල් ලයිට් ආදිය ක්‍රියානොකිරීමක් දක්නට ලැබෙන බව ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව සියළු වාහන වල තත්ත්ව වාර්තාවක් ගෙන සිදුකළ යුතු අළුත්වැඩියාවන් ඉටු කරන ලෙස හා වාහන වල වගකීම් රියදුරන් වෙත පවරා දීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.7 ජනප්‍රිය මාවතේ කසල ගොඩක් ඇති අතර එය ඉවත් කරන ලෙස කිහිප වරක් පවසා සිටියද එය මේවන තෙක් ඉටු වී නොමැති බව ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව අදාළ කසල ගොඩ හැකි ඉක්මණින් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.8 ජෝතිරතන පාර හංදියේ කාපට් පාර මත කසල ගිනිතබා පිච්චීමට කටයුතු කරන අතර එමගින් මාර්ගයට හානී සිදුවන බව ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව අදාළ ස්ථානය පරීක්ෂා කර එය අදාළ පාර්ශවයන් වෙත නිසි උපදෙස් ලබාදීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.9 හඩිසන් උද්‍යානයේ හා පිහිණුම් තටාකයේ ඇති වැසිකිළි පරීක්ෂා කිරීමට ලක්කල අතර ඒවායේ මකුළු දැල් බැඳී පවතින බව ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව එම ස්ථාන සඳහා අනුයුක්ත කර ඇති සේවකයින් මඟින් අදාළ වැසිකිළි පද්ධති කඩිනමින් පිරිසිදු කිරීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.10 නගරයේ නැවතත් අයාලේ යන ගවයන් ගැවසෙන අතර එමගින් ජනතාවට යම් අනතුරක් සිදුවිය හැකි බව ගරු සභාපතිතුමා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී. ඒ අනුව දැන්වීම් පළ කරමින් ගවයන් ඇල්ලීමට පුද්ගලයින් සොයා ගනිමින් මෙම ගවයින් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.11 සුනඛ ගහණයද නගරයේ අධික වී ඇති බවත් පෙර සුනඛයින් ව්‍යන්ධීකරණයට ලක්කර ඇති බැවින් අනෙකුත් සුනඛයින් ව්‍යන්ධීකරණය සඳහා වැඩසටහනක් සංවිධානය කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් කමිටුව වෙත පවසා සිටි අතර එය කමිටුවේ සියළු සාමාජිකයින්ගේ එකඟත්වය මත නිර්දේශ කරන ලදී.

5.12 කසල අංගනයේ වාහන සේදීම සඳහා ස්ථානයක් කොන්ක්‍රීට් යොදා සකස් කර දෙන ලෙසත් කසල අංගනයේ ඇති වලවල් කොන්ක්‍රීට් දමා වසා දෙන ලෙසත් සෞඛ්‍ය පරිපාලක රවිත් මහතා විසින් කමිටුවෙන් ඉල්ලා සිටින ලදී.ඒ අනුව වාහන සේදීම සඳහා ස්ථානයක් සකස් කිරීමටත් කසල අංගනයේ ඇති වලවල් කොන්ක්‍රීට් දමා වසා දැමීමටත් අදාළව ඇස්තමේන්තු සකස් කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර2022.10.13 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටු නිර්දේශ ,අනුමත කිරීමට තීරණය කරන ලදී.

(ඊ.1.5.3)2022.10.13 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

ඒ අනුව 2022.10.13 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ ඇතුළත් වාර්තාව පහත පරිදි වේ.

පාණදුර නගර සභාව

කර්මාන්ත හා නගර සභා දේපළ සංරක්ෂණ කමිටු වාර්තාව

දිනය : - 2022.10.13
වේලාව : - පෙ.ව. 11.30
ස්ථානය : - පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයින්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත
2	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	ඇත
3	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
4	ගරු නාගරික මන්ත්‍රී	විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා	ඇත
5	ගරු නාගරික මන්ත්‍රී	එම්. පියසේන ප්‍රනාන්දු මහතා	ඇත
6	ගරු නාගරික මන්ත්‍රී	ලලීන් හසන්ත රුද්‍රිගෝ මහතා	ඇත
7	ගරු නාගරික මන්ත්‍රී	මහින්ද පුන්සිරි මහතා	ඇත
8	ගරු නාගරික මන්ත්‍රී	ආර්. බන්දුල සොයිසා මහතා	ඇත
9	ගරු නාගරික මන්ත්‍රී	ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මිය	ඇත

සහභාගී වූ වෙනත් නිළධාරීන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
2	වැඩ අධිකාරී	කේ.පී.මායාරත්න මහතා	ඇත
3	තාක්ෂණ නිළධාරී	එස්.ඩී.ආර්. තුෂාරා මිය	ඇත
4	තාක්ෂණ නිළධාරී	ප්‍රසාදි විජේරත්න මිය	ඇත
5	තාක්ෂණ නිළධාරී	ජයන්ත ඇල්පිටිය මහතා	ඇත
6	අංශ ප්‍රධානී (කර්මාන්ත)	තමිලා විජයසිංහ මිය	ඇත
7	සංවර්ධන නිළධාරී(නීති)	ඉමල්කා වේරගම මිය	ඇත
8	පරිපාලක	නිමල් අල්විස් මහතා	ඇත
9	ක්‍රීඩාභූමි භාරකරු	නාමල් ජයවර්ධන මහතා	ඇත
10	වැඩ අධීක්ෂක	චමිල ලසන්ත මහතා	ඇත
11	වැඩ අධීක්ෂක	චරිත් වික්‍රමසූරිය මහතා	ඇත

01.PUC/05/03/01-01/2020 ලිපිගොනුවට අනුව PE-6871 කැබ් රථයේ වම්පස ඉදිරිපස දොර වීදුරුව අලුතින් යෙදීම වෙනුවෙන් KalutaraWindscreen ආයතනය වෙත ගෙවිය යුතු රු 18,500.00 ක මුදල ගෙවීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 18,500.00 ක මුදල, KalutaraWindscreen ආයතනය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

02. PUC/05/03/01-05/2020 ලිපිගොනුවට අනුව ZA-2794 දරණ JCB රථයේ ස්ටාටර් මෝටරය ජේ.ඒ.මෝටර්ස් ආයතනය වෙතින් අලුත්වැඩියා කර ගැනීම නිසා එම ආයතනය වෙත ගෙවිය යුතු රු 11,400.00 ක මුදල ගෙවීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

සොලවනයිට්	- රු 6500.00
බ්‍රෂ් සෙට්	- රු 1850.00
කන්ටැක් කෑලි	- රු 1600.00
වැඩ කුලිය	- රු 1450.00
	රු 11400.00

රු 11,400.00 ක මුදල, ජේ.ඒ.මෝටර්ස් ආයතනය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

03.PUC/5/4/1/3/2022 වායු සමීකරණ යන්ත්‍ර සේවා කිරීම ලිපිගොනුවට අනුව,ප්‍රධාන කාර්යාලයේ හා නගර ශාලාවේ පවතින වායු සමීකරණ යන්ත්‍ර 24 ක්,එක් වරක් සේවා කිරීම වෙනුවෙන් MAIND & TECH ආයතනය (2022.08.24 දින ටෙන්ඩර් කමිටුවේදී තෝරා ගන්නා ලද ආයතනය) විසින් එවා ඇති රු 129,000.00 ක මුදල එම ආයතනයේ හිමිකරුවන රොෂාන් චාමර මයා වෙත ගෙවීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 129,000.00 ක මුදල , MAIND & TECH ආයතනයේ හිමිකරුවන රොෂාන් චාමර මයා වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

04. PUC/5/4/1/3/2022 වායු සමීකරණ යන්ත්‍ර සේවා කිරීම ලිපිගොනුවට අනුව,ප්‍රධාන කාර්යාලයේ පවතින වායු සමීකරණ යන්ත්‍ර 04 ක් සහ සභාපති නිල කාමරයේ පවතින වායු සමීකරණ යන්ත්‍රය සේවා කිරීම වෙනුවෙන් MAIND & TECH ආයතනය (2022.08.24 දින ටෙන්ඩර් කමිටුවේදී තෝරා ගන්නා ලද ආයතනය) විසින් එවා ඇති රු 18,000.00 ක මුදල එම ආයතනයේ හිමිකරුවන රොෂාන් චාමර මයා වෙත ගෙවීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 18,000.00 ක මුදල , MAIND & TECH ආයතනයේ හිමිකරුවන රොෂාන් චාමර මයා වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

05. PUC/5/4/1/3/2022 වායු සමීකරණ යන්ත්‍ර සේවා කිරීම ලිපිගොනුවට අනුව ,නගර ශාලාවේ පවතින වායු සමීකරණ යන්ත්‍ර 12,2022.09.17 වන දින MAIND & TECH ආයතනය (2022.08.24 දින ටෙන්ඩර් කමිටුවේදී තෝරා ගන්නා ලද ආයතනය) විසින් සේවා කරන ලදී.එහිදී ඉහත කී යන්ත්‍ර 12 ක් ඉතා පැරණි ඒවා බැවින් යන්ත්‍ර කිහිපයක් අලුත්වැඩියාවන් සිදු කළ යුතුව ඇති බව දන්වන ලද අතර ඒ වෙනුවෙන් එවා ඇති රු 52,600.00 ක මිල ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 52,600.00 ක මිල ඇස්තමේන්තුව,කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

06. PUC/5/6/04/02/2021 පාණදුර ,රත්නපුර මාර්ගයේ ජාතික තරුණ සේවා සභාව අසලින් ආරම්භ වී දොස්තර නෙවිල් ප්‍රනාන්දු පාර අසලින් අවසන් වන මාර්ගය,පණ්ඩිත් ඩබ්.ඩී.අමරදේව මාවත ලෙස නම් කිරීමේ ලිපිගොනුවට අනුව, එකී මාර්ගයේ මානක සැලසුම සකසා ගැනීම සඳහා පී.අජිත් පී ද සිල්වා මිනින්දෝරු මහතා වෙත සභාව විසින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව ,එම මාර්ගය මැනුම් කර,පිඹුර ඉදිරිපත් කිරීම සඳහා ඔහු විසින් ඉදිරිපත් කර ඇති රු 27,000.00 ක්වූ මිල ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 27,000.00 ක මිල ඇස්තමේන්තුව , කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

07. PUC/5/4/2/22-2021 තන්තිරිමුල්ල පුස්තකාලය ඉදිකිරීම (අදියර 02) ලිපිගොනුවට අනුව, එකී කර්මාන්තය ඉටු කිරීම වෙනුවෙන් සකසන ලද රු 835,000.00 ක් වන සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 835,000.00 ක් වන සංශෝධිත ඇස්තමේන්තුව , කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

08. PUC/5/4/2/22-2021 තන්තිරිමුල්ල පුස්තකාලය ඉදිකිරීම (අදියර 03) ලිපිගොනුවට අනුව, එකී කර්මාන්තය ඉටු කිරීම වෙනුවෙන් සකසන ලද රු 3,000,000.00 ක් වන සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 3,000,000.00 ක් වන සංශෝධිත ඇස්තමේන්තුව , කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

09. PUC/5/4/2/5/2022 ලිපිගොනුවට අනුව මිනුවන්පිටිය සුසාන භූමිය වටා තාප්පය ඉදිකිරීම(අදියර 1) ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇති රු 1,000,000.00 ප්‍රතිපාදන වලින් ඉතිරිව ඇති රු 224,427.82 ක මුදලින්, එම තාප්පයේ කපරාරු වැඩ ඉටු කිරීම සඳහා ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය විසින් 2022.08.29 දිනැති ලිපියෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය මිල ඉහළ ගොස් ඇති බැවින් එම මිල සංශෝධනය කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

2022.10.04 දින පැවති ව්‍යාපෘති සම්බන්ධ ප්‍රගති සමාලෝචන රැස්වීමේදී අදාල සමිතියේ මිල ගණන් සංශෝධනය පිළිබඳ විමසීම් කරන ලද අතර ව්‍යාපෘති කාලයද ඉක්මවා ගොස් ඇති බැවින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධව මිල ගණන් සංශෝධනය සලකා නොහැකි බව දැනුම් දුනි.කර්මාන්ත කමිටුවේ දැනගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

කර්මාන්ත කමිටුවේ අවධානය යොමු විය.

10.PUC/5/4/1/04-2021 කර්මාන්ත පොදු ගොනුවට අනුව පාණදුර මිනුවම්පිටිය පොදු සුසාන භූමියේ බුද්ධ ප්‍රතිමාවක් තැන්පත් කිරීම සඳහා පාණදුර,පෙරේරා මාවත,අංක 48 හී පිහිටි ජන උරුමය සංවිධානය ඉල්ලුම් කර ඇති අතර 2022.09.08 දිනැති මහා සභා තීරණය පරිදි ප්‍රතිමාව තැන්පත් කිරීම සඳහා වහලක් සහිත වේදිකාවේ සැලැස්ම ඉදිරිපත් කර ඇත.ඒ අනුව අදාළ ප්‍රතිමාව තැන්පත් කිරීම සම්බන්ධයෙන් ඉදිරි තීරණයන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා කර්මාන්ත කමිටුව වෙත යොමු කරන ලදී.

මිනුවම්පිටිය සුසාන භූමියට ඇතුළු වන මාර්ගයේ කෙළවර,තාප්පයට ආසන්න ස්ථානය ඉදිකිරීම සඳහා ලබාදීමටත් අදාළ ඉදිකිරීම් සඳහා යන සියළු වියදම් ජන උරුමය සංවිධානය විසින් දැරිය යුතු බවටත් කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

11. <u>සාකච්ඡා කරන ලද වෙනත් කරුණු</u>

11.1 PUC/5/4/1/5-2022 මිනුවන්පිටිය සුසාන භූමියේ අළුකුටි ඉදිකිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් සකස් කරන ලද රු 1,900,000.00 ක් වන සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 1,900,000.00 ක් වන සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

11.2 අළුත්වැඩියා කිරීමට නියමිතව තිබූ ට්‍රැක්ටර් රථය මේවන විට අළුත්වැඩියා කර අවසන් බැවින් අනෙකුත් ට්‍රැක්ටර් රථද එකින් එක අළුත්වැඩියා කිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී ලලීන් හසන්ත රුදිගෝ මහතා කමිටුව වෙත පවසා සිටි අතර ඒ අනුව අනෙකුත් ට්‍රැක්ටර් රථවලද කළ යුතු අළුත්වැඩියාවන් එකින් එක සිදුකිරීමට කටයුතු කරන ලෙස කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

11.3 අගමැති බාලිකා විදුහල වෙත යන මාර්ගය ආරම්භයේ ඇති කාගිල්ස් ෆුඩ්සිටි ආයතනය ආසන්න මාර්ගයේ වාහන නවතා තැබීම හේතුවෙන් මාර්ග අවහිරතාවයක් මෙන්ම පදිකයින් ගමන් ගැනීමේදී අවහිරතාවයන්ට මුහුණ දීමට සිදුවන බැවින් එය වැළැක්වීමට යම් පියවරක් ගත යුතු බව ගරු නාගරික මන්ත්‍රී ලලීන් හසන්ත රුදිගෝ මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව එම මාර්ගය අසළ වාහන නවතා තැබීම තහනම් යනුවෙන් පුවරු ස්ථාපිත කිරීමට කටයුතු කිරීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

11.4 කුරුප්පුමුල්ල පහළ ඉඩම් කෑල්ලක පදිංචි සෝමපාර පෙරේරා මහතා වෙත එම ඉඩම් කෑල්ල ලබාදීම සඳහා සභාව විසින් මහා සභා වාරයකදී යෝජනා සම්මතයක් ලබාගෙන ඇති බැවින් එම මහතා විසින් මෙම ඉඩම් කෑල්ල ඔහු වෙත ලබාදෙන ලෙස ඉල්ලීම් කරමින් සිටින බව ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.අදාළ සභා තීරණය සලකා බලමින් හා වර්තමානයේ සභා සතු දේපළ පැවරීම සම්බන්ධයෙන් පවතින නීති සලකා බලමින් මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු ඉටු කරන ලෙස කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

11.5 දේශ සේවා මාවතේ වම් පැත්තේ කෙළින් වීදියේ කාණුවට කොන්ක්‍රීට් ස්ලැබ් දැමිය යුතු බව ගරු නාගරික මන්ත්‍රී ආර්.බන්දුල සොයිසා මහතා විසින් පවසා සිටි අතර ඒ අනුව අදාළ ස්ථානය පරීක්ෂා කර කාණුව සඳහා කොන්ක්‍රීට් ස්ලැබ් දැමීමට කටයුතු කරන ලෙස කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

11.6 වාහන අනතුරු සිදුවිය හැකි බැවින් උඩහමුල්ල කන්ද මුදුනේද මාලමුල්ලට හැරෙන හන්දියේද හිරණ පාරේ වංගුවේද සර් ජේම්ස් පීරිස් මාවතේ සිට දකුණු දෙසට හැරෙන ස්ථානය සඳහාද උත්තල දර්පණ 03 ක් සවිකිරීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

11.7 කුණුකොටුවවත්ත පදිංචි ජනතාවට ඔප්පු ලබාදීමට අදාලව ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා මහතා සමඟ නිවාස සියල්ලටම ගොස් පරීක්ෂා කිරීම් කළ අතර එක් විරෝධතාවයක් පමණක් ඉදිරිපත් වුණා.එනම් එක් නිවාසයක පදිංචිව සිටින්නේ මව වන අතර පුතා විසින් ඔප්පු ලිවීමේදී මවගේ නමට නොලියා ඔහුගේ නමට ලියන ලෙස ඉල්ලීම.නමුදු එහි පදිංචිව සිටියේ මව වන බැවින් එයද පැහැදිලියි ඔප්පුව ලබාදිය යුත්තේ මවට බව යැයි ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා විසින් පවසා සිටින ලදී.ඒ අනුව අදාළ නිවාස

වල ඔප්පු ලබාදීමේ කටයුතු සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු කරන ලෙස කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර2022.10.13 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ ,අනුමත කිරීමට තීරණය කරන ලදී.

(ඊ.1.5.4) 2022.10.20 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

ඒ අනුව 2022.10.20 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු කමිටු නිර්දේශ ඇතුළත් වාර්තාව පහත පරිදි වේ.

පාණදුර නගර සභාව

මුදල් කමිටු රැස්වීම් වාර්තාව

දිනය :2022.10.20

වේලාව : පෙ.ව.10.00

ස්ථානය :පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
01	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත
02	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	ඇත
03	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
04	ගරු නාගරික මන්ත්‍රී	විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා	නැත
05	ගරු නාගරික මන්ත්‍රී	කේ.ඩී.අශෝකා රත්නමාලි මිය	ඇත
06	ගරු නාගරික මන්ත්‍රී	කුමුදු ප්‍රනාන්දු මහතා	ඇත
07	ගරු නාගරික මන්ත්‍රී	ලලීන් හසන්ත රුදිගෝ මහතා	ඇත
08	ගරු නාගරික මන්ත්‍රී	පද්මා කොස්තා මිය	නැත
09	ගරු නාගරික මන්ත්‍රී	ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය	ඇත

සහභාගී වූ වෙනත් නිලධාරී

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
01	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
02	ගණකාධිකාරී	තිලක් මුණසිංහ මහතා	ඇත
03	පරිපාලන නිළධාරී (වැ.බ)	කුමුදු අබේසේකර මිය	ඇත
04	වැඩ අධිකාරී	කේ.පී.මායාරත්න මහතා	ඇත
05	අභ්‍යන්තර විගණන නිළධාරී	කේ.සී. ද සිල්වා මිය	ඇත
06	අංශ ප්‍රධානී (ආයතන)	කේ.ඩී.යූ.පී.ජයරත්න මිය	ඇත
07	අංශ ප්‍රධානී (වරිපනම්)	ඩී.ඩී.ඒ.එල්.ශ්‍රියාණි මිය	ඇත

08	අංශ ප්‍රධානී (කර්මාන්ත)	තමිලා විජයසිංහ මිය	ඇත
09	අංශ ප්‍රධානී (සෞඛ්‍ය)	එච්.ටී. හෙට්ටිආරච්චි මිය	ඇත
10	අංශ ප්‍රධානී (මිශ්‍ර ආදායම්)	ෂමිලා ධර්මරත්න මිය	ඇත
11	අංශ ප්‍රධානී (ගිණුම්)	ඒ.ඒ.චන්ද්‍රිකා මිය	ඇත
12	සැපයුම් නිළධාරී	වයි.ඩී.කේ.පෙරේරා මහතා	ඇත
13	සංවර්ධන නිලධාරී (ප්‍රජා සංවර්ධන)	ඉරෝම් යසෝධා කුරුප්පු ආරච්චි මිය	ඇත
14	ආදායම් පරීක්ෂක	පී.එම්.පියල් පද්මචන්ද්‍ර මහතා	ඇත
15	ආදායම් පරීක්ෂක	ටී.සුනිල් ජයලාල් මහතා	ඇත
16	ආදායම් පරිපාලක (වැ.බ.)	ඩබ්.ඉරාන් ධර්මප්‍රිය මහතා	ඇත
17	ආදායම් පරිපාලක (වැ.බ.)	තරංග ජනකමිණි මහතා	ඇත
18	ආදායම් පරිපාලක (වැ.බ.)	සුරේෂ් මධුරංග මහතා	ඇත
19	ආදායම් පරිපාලක (වැ.බ.)	දර්ශණ ඒකනායක මහතා	ඇත
20	ආදායම් පරිපාලක (වැ.බ.)	එච්.එම්.කේ.කුලතුංග මහතා	ඇත
21	ආදායම් පරිපාලක (වැ.බ.)	ශමීන් අනුෂ්ක මහතා	ඇත

01. <u>ගිණුම් අංශය</u>

1.1 නගර සභා ආඥා පනතේ 178 වගන්තියේ (1) යටතේ සංවර්ධන , පරිපාලන හා සමාජ සුභ සාධන යෝජනා සහිත ආදායම් හා වියදම් ඇස්තමේන්තු ඇතුළත් පාණදුර නගර සභාවේ 2023 වර්ෂය සඳහා වූ අයවැය ලේඛණය මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

2023 වර්ෂය සඳහා වූ අයවැය ලේඛණය මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

1.2 PUC/02/01/06/2022 ලිපිගොනුව අනුව 2022 ,03 වන කාර්තුවට අදාළ (ජූලි-සැප්තැම්බර්) මුද්දර තැන්පත් මුදල වන රු 288,000.00 ක මුදල ,දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීම මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවූ රු 288,000.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

02. <u>වරිපනම් අංශය</u>

2.1 ලිපි ගොනු අංකය PUC/03/07/15/2022

කොට්ඨාශ අංකය හා වීදිය	08, සොලමන් මාවත
අයිතිකරු	රජය හිමිකම් කියයි/එස්.එම්.පෙරේරා
වරිපනම් අංක	57/46 A
දේපල විස්තරය	වාණිජ්‍ය
හිග බදු මුදල	රු 9100/=
වාර්ෂික වටිනාකම	රු.10,500/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.09.21
ඉල්ලීම	අදාල ස්ථානයේ කිසිදු ව්‍යාපාරික කටයුත්තක් සිදු නොකරන බැවින් වරිපනම් අංකය ඉවත් කර දෙන ලෙස
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	අදාල ස්ථානයේ කිසිදු ව්‍යාපාරයක් නොමැති බැවින් වරිපනම් අංකය ඉවත් කරන ලෙස

හිඟ ගෙවීමට යටත්ව වරිපනම් බදු ප්‍රතිශතය 5% දක්වා අඩු කිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කළ අතර වරිපනම් අංකය ලේඛණයෙන් ඉවත් කිරීම සඳහා විරෝධතා කමිටුවට යොමු කිරීමත් මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.2 ලිපි ගොනු අංකය PUC/03/02/4/14/2022

කොට්ඨාශ අංකය හා වීදිය	01, ගාලු පාර	
අයිතිකරු	වයි.සුජීවා පෙරේරා	
වරිපනම් අංක	212	212 1/1
දේපල විස්තරය	වාණිජ්‍ය	වාණිජ්‍ය
හිග බදු මුදල	නැත	4572.50
වාර්ෂික වටිනාකම	රු.80,000/=	රු 31,000/=
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.09.06	
ඉල්ලීම	අනුකූලතා සහතිකය ලබා ගත්තද ව්‍යාපාරික කටයුතු ආරම්භ කර නොමැති බැවින් වරිපනම් බදු අය කිරීම අත්හිටුවන ලෙස	
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	ව්‍යාපාරික ස්ථාන ආරම්භ කර නොමැති බැවින් 2022/04 කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතයටබදු අයකිරීම	

හිඟ අයකිරීමට යටත්ව ව්‍යාපාරික ස්ථාන ආරම්භ කර නොමැති බැවින් 2022/04 කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතයට බදු අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.3 ලිපි ගොනු අංකය PUC/03/02/04/15/2022

කොට්ඨාශ අංකය හා වීදිය	01, අධිනීතිඥ ලෙනින් ප්‍රනාන්දු මාවත
අයිතිකරු	මනෝරි ප්‍රියංගිකා විමලරත්න
වරිපනම් අංක	87
දේපල විස්තරය	වාණිජ්‍ය
හිග බදු මුදල	රු 126,450/=
වාර්ෂික වටිනාකම	රු 187,500/=
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.09.26
ඉල්ලීම	ආර්ථික අපහසුතා හා ව්‍යාපාරික කටයුතු අඩපන වී ඇති බැවින් හිඟ මුදල මාස 10 කින් ගෙවීමට කටයුතු සලසන ලෙස
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	රු 126,450/= ක හිඟ මුදල (කාර්තු ගාස්තුව රු 9375/=) වාරික 05 කින් ගෙවීමට

රු 126,450/= ක හිඟ මුදල ,2022.12.15 වන දිනට පෙර අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.4 ලිපි ගොනු අංකය PUC/03/05/

කොට්ඨාශ අංකය හා වීදිය	04, ද සොයිසා පාර	
අයිතිකරු	එච්.එන්.ප්‍රියන්ති ප්‍රනාන්දු	
වරිපනම් අංක	37/21	37/21 1/1
දේපල විස්තරය	වාණිජ්‍ය	වාණිජ්‍ය
හිග බදු මුදල	නැත	නැත
වාර්ෂික වටිනාකම	රු.37,500/-	රු.27,000/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.08.30	
ඉල්ලීම	ව්‍යාපාරික ස්ථාන වසා ඇති බැවින් වරිපනම් බදු සහනයක් ලබාදෙන ලෙස	
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	ව්‍යාපාරික ස්ථාන වසා දමා ඇති බැවින් 2022/04 කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතයට බදු අයකිරීම	

ව්‍යාපාරික ස්ථාන වසා දමා ඇති බැවින් 2022/04 කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතයට බදු අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.5 ලිපි ගොනු අංකය PUC/03/07/14/2022

කොට්ඨාශ අංකය හා වීදිය	08, ඩයස් පෙදෙස
අයිතිකරු	මලිත් ද මැල්
වරිපනම් අංක	23
දේපල විස්තරය	නේවාසික
හිග බදු මුදල	නැත
වාර්ෂික වටිනාකම	රු.84,906/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.09.14
ඉල්ලීම	ආදායම් පරිපාලක (වැ.බ) දර්ශණ ඒකනායක මයා වරිපනම් බදු නොගෙවූ දේපල සඳහා අවසාන නිවේදන බෙදීමේදී නිරීක්ෂණය වූ කරුණු
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	මෙකී ඉඩම ප්‍රයිම් ලෑන්ඩ්ස් ආයතනයෙන් මිලදී ගෙන අදාල නිවස කඩා ඉවත් කර ඇත.එකී දේපළ සඳහා නව වරිපනම් අංක 25-25/9 දක්වා ලබාදී ඇත.හිඟ වරිපනම් බදු මුදල වන රු 10,614/= ක මුදල අදාළ ආයතනයෙන් ගෙවා ඇත.මෙකී දේපළ ලේඛණයෙන් ඉවත් කිරීම

පැවති නිවස කඩා ඉවත් කර , එකී දේපළ සඳහා නව වරිපනම් අංක 25-25/9 දක්වා ලබාදී ඇති බැවින් වරිපනම් අංක 23 දරණ දේපළ ලේඛණයෙන් ඉවත් කිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.6 ලිපි ගොනු අංකය PUC/03/07/14/2022

කොට්ඨාශ අංකය හා වීදිය	08, ශ්‍රී මහ විහාර පටුමඟ
අයිතිකරු	භාරකරු ශ්‍රී මහ විහාරය
වරිපනම් අංක	25/6
දේපල විස්තරය	වාණිජ්‍ය
හිග බදු මුදල	රු 38,999.59
වාර්ෂික වටිනාකම	රු.18,000/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.09.14
ඉල්ලීම	ආදායම් පරිපාලක (වැ.බ) දර්ශණ ඒකනායක මයා වරිපනම් බදු නොගෙවූ දේපල සඳහා අවසාන නිවේදන බෙදීමේදී නිරීක්ෂණය වූ කරුණු
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	ඉහත අංකයට දේපලක් විහාරස්ථානයේ නොමැති බැවින්ද 2020 නව තක්සේරුවේදී මෙම අංකය ඉවත් කර ඇති බැවින්ද ඉහත හිඟ මුදල කපාහැරීමට හා දේපළ ලේඛණයෙන් ඉවත් කිරීම

මේ සම්බන්ධව ස්ථානීය පරීක්ෂණ සිදුකර නැවත සාකච්ඡා කිරීම සඳහා කල්තබන ලදී.

2.7 ලිපි ගොනු අංකය PUC/03/04/14/2022

කොට්ඨාශ අංකය හා වීදිය	08, ශ්‍රියා මාවත
අයිතිකරු	ඩී.පී.ජයවර්ධන හා තවත් අය(හිමිකම් කියයි ජී.ඒ.කුසුමාවතී)
වරිපනම් අංක	61
දේපල විස්තරය	නේවාසික
හිග බදු මුදල	රු 17,711.16
8.1 <u>මිශ්‍ර ආදායම් අංශය</u>

8.1.1 වාද්දුව,මාවල,මහරුක්ම පාර,මෙතදිසි සෙවන, 191/3/ඒ ලිපිනයේ පදිංචි ඩබ්.විජය කුමාර මහතා විසින් පාණදුර රෝහල ඉදිරිපිට රාත්‍රියේදී රෝද හතරක කරත්තයක් තබා ආහාර වෙළඳාම් කිරීමට අවසර ඉල්ලා ඇත.ඔහුගට ස්ථිර රැකියාවක් නොමැති බවත්,දරුවන් පෝෂණය කිරීමට ජංගම වෙළඳාමේ නිරත වීමට අපේක්ෂා කරන බවත් 2022.10.10 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.රෝහල ඉදිරිපිට ජංගම වෙළඳාම් කිරීම රෝහල් පරිශ්‍රයට බාධාවක් විය හැක.ඒ සඳහා අවසර ලබාදීම සම්බන්ධයෙන් මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රෝහල ඉදිරිපිට ජංගම වෙළඳාම් කිරීම රෝහල් පරිශ්‍රයට බාධාවක් විය හැකි බැවින් ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී.

8.1.2 පාණදුර,කළුදැවල,ජයවිරු පටුමඟ,සමඟි මාවත,අංක 158/04 ලිපිනයේ පදිංචි ටී.එම්.ලාලනි යන අය විසින් පාණදුර වෙරළ උද්‍යානයේ පෝනියාගේ පිටේ ළමුන් සංචාරය කිරීමඟී මීට වසර 02 ට පෙර නිරත වී ඇත.නමුත් රටේ පැවති කොරෝනා තත්ත්වය නිසා එම ව්‍යාපාරය නතර වී ඇති අතර නැවත එම ව්‍යාපාරයේ නිරත වීමට 2022.10.03 දිනැති ලිපිය මඟින් අවසර ඉල්ලා ඇත.ආදායම් පරීක්ෂක නිර්දේශ අනුව දිනකට රු 500.00 බැඟින් අයකර අවසර ලබා දීමට මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

දිනකට රු 500.00 බැඟින් අයකර අවසර ලබා දීම මුදල් කමිටුව විසින් නිර්දේශ කළ අතර දිනය ආරම්භයේදී මුදල් අයකිරීමට කටයුතු කරන ලෙසද මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.1.3 පාණදුර,හොරණ පාර,නො.83 ලිපිනයේ සුපර් ෆැෂන් ආයතනය විසින් දිනකට රු 3000.00 ක මුදලක් අයකිරීමේ පදනම මත ටෙනිස් පිටිය වෙන් කර ඇත.නමුත් 2022 වර්ෂයේ මැයි හා ජූලි මස සඳහා ටෙනිස් පිටිය භාවිතා නොකළ බව 2022.10.01 දිනැති ලිපිය මඟින් දන්වා ඇති අතර එම දෙමස සඳහා මුදල් ගෙවීමක් ද සිදුකර නැත.රටේ පැවති ඌග්‍ර ඉන්ධන භීඟය නිසා ටෙනිස් පිටිය භාවිතා නොකළ බව පවසන අතර 2022 මැයි හා ජූලි මස මුදල් ගෙවීමට සහනයක් ලබා ගැනීමට ඉල්ලීමක් කර ඇත.

එසේම මෙම රථගාලේ නවතා තබන වාහන වෙනුවෙන් කිසිදු ගාස්තුවක් අය නොකරන බවත් සුපර් ෆැෂන් ආයතනය විසින් වාචිකව දන්වා ඇත.

මැයි හා ජූලි මාස වලදී රථගාලේ වාහන නතර කිරීම සිදු වූයේ ඉතා අල්ප වශයෙන් බව නගරශාලා භාරකරු විසින් දන්වා ඇත.

ඒ අනුව මැයි හා ජූලි මාස 02 සඳහා සහනයක් ලබාදීම සම්බන්ධයෙන් මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

2022 මැයි හා ජූලි මසට අදාළ ගාස්තුවෙන් 1/3 ක් පමණක් නිදහස් කිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.1.4 පාණදුර,ගාළු පාර,500/3 බී,ලිපිනයේ පෝසිලේන් ලංකා ආයතනයේ හිමිකරු වන ඩබ්.දුලිප් ද මැල් මහතා විසින් 2022.11.14 වන දින සිට 2023.01.05 දින දක්වා පුස්තකාල භූමියේ A කොටස වෙන්කර ඇත.පුස්තකාල භූමිය වෙන් කිරීමේ ගාස්තු නව මිල ගණන් යටතේ පහත පරිදි වේ.

A කොටස (කිරිහළ ළඟ කොටස-දිනකට)	- රු 7000.00
විදුලිය හා ජලය (දිනකට)	- රු 4500.00
තැම්පතු මුදල	- රු 2000.00
පෝරම ගාස්තුව	- රු 750.00

ඒ අනුව 2022.11.14 වන දින සිට 2023.01.05 දින දක්වා දින 53 ක් සඳහා මුළු ගාස්තුව පහත පරිදි වේ.

අය ශීර්ෂය	මුදල
පුස්තකාල භූමිය වෙන්කිරීම 2022.11.14 සිට 2023.01.05 (රු 7000.00 x දින 53)	රු 371,000.00
ජලය හා විදුලිය (රු 4500.00 X 53)	රු 238,500.00
තැම්පතු මුදල	රු 2000.00
පෝරම ගාස්තුව	රු 750.00
එකතුව	රු 612,250.00

මුළු මුදල වන රු 612,250.00 ක මුදල,වාරික 03 කින් ගෙවීමට ලබාදෙන ලෙස ඉල්ලුම්කරු විසින් ඉල්ලා ඇති අතර අදාළ ඉල්ලීම මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 612,250.00 ක මුදල,වාරික 03 කින් ගෙවීමට ලබාදීම මුදල් කමිටුව විසින් නිර්දේශ කළ අතර වාරික 03 ගෙවීම සඳහා නිශ්චිත දින ලබාදීමට කටයුතු කරන ලෙසද මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.1.5 2023 වර්ෂය සඳහා පහත සඳහන් දේපළ වාර්ෂික පදනමින් බදු දීම සඳහා ආදායම් පරීක්ෂක නිර්දේශ පහත පරිදි වේ.

අනු අංකය	බදු දෙන දේපළ	2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා උපයා ඇති ආදායම	ආදායම් පරීක්ෂක නිර්දේශය	අවම ලංසු වටිනාකම වර්ෂයකට(රු)
01	කසල අංගනය අසල රථගාල	රු 610,340.00	2022 වර්ෂය සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් බදු කුලිය ලෙස එවා ඇති රු 1,080,000.00 ක මුදල නිර්දේශ කර ඇත.	1,080,000.00
02	පාණදුර වෙරළ රථගාල	රු 470,600.00	සේවකයින් විධිමත් ලෙස යොදවා ආදායම් ලබා ගැනීම සුදුසු බව නිර්දේශ කර ඇත.	

03	වෙරළ වැසිකිළිය	රු 584,140.00	දැනට සිටින සේවකයින් විධිමත් ලෙස යොදවා මුදල් අයකර ගැනීම සුදුසු බව නිර්දේශ කර ඇත.	
04	නගර ශාලාවේ වැසිකිළිය		පළමුවරට ලංසු කැඳවන බැවින් මසකට රු 40,000.00 බැගින් මුදල් අය කිරීම නිර්දේශ කර ඇත.	480,000.00

ඉහත නිර්දේශ අනුව 2023 වර්ෂය සඳහා පහත දේපළ වාර්ෂික පදනමින් බදු දීම සඳහා ලංසු පෝරම ගාස්තු රු 1500.00 ලෙසත් ලංසු තැන්පතු මුදල් හා ලංසු වටිනාකම් ,මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

අනු අංකය	බදු දෙන දේපළ	2023 වර්ෂය සඳහා ලංසු තැන්පතු මුදල(රු)	2023 වර්ෂය සඳහා අවම ලංසු වටිනාකම (රු)
01	කසල අංගනය අසල රථගාල	15,000.00	1,080,000.00
02	නගර ශාලාවේ වැසිකිළිය	15,000.00	480,000.00

කසල අංගනය අසල රථගාලේ ආදායම තවදුරටත් සහා සේවකයින් යොදවමින් පරීක්ෂා කළ යුතු අතර නගර ශාලාවේ වැසිකිළිය,අළුත්වැඩියා කිරීමට ඇති බැවින් මෙම ස්ථාන 02 ක මේ අවස්ථාවේ බදුදීම මුදල් කමිටුව විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

8.2 <u>සැපයුම් අංශය</u>

8.2.1 කර්මාන්ත අංශයේ කරන ලද ඉල්ලීමට අනුව LL-6996 ටිපර් රථය සඳහා 900x20 ceat වර්ගයේ ටයර් 3 ක් මිලදී ගැනීමට අදාලව රත්න ටයර් පුද්.සමාගම වෙත 2022.07.26 දින සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු.259,550.00 ක මුදල, මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රත්න ටයර් පුද්.සමාගම වෙත ගෙවන ලද රු 259,550.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.2.2 සෞඛ්‍ය අංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව ආදාහනාගාරය සඳහා ඇම්පියර් 35 ක බැටරියක් මිලදී ගැනීමට අදාලව නිව් පියසේන මෝටර් ස්ටෝර්ස් වෙත 2022.08.04 දින සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු.17,000.00 මුදල,මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

නිව් පියසේන මෝටර් ස්ටෝර්ස් වෙත ගෙවන ලද රු 17,000.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.2.3 කර්මාන්ත අංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව ZB-0323 කම්පැක්ටර් රථය සඳහා ඇම්පියර් 100 බැටරි 2 ක් මිලදී ගැනීමට අදාලව පවර් වීල් පුද්ගලික සමාගම වෙත 2022.08.04 දින සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු.130,800.00 ක මුදල, මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

පවර් වීල් පුද්ගලික සමාගම වෙත ගෙවන ලද රු 130,800.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.2.4 සෞඛ්‍ය අංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව RA-2516 ට්‍රැක්ටර් රථය සඳහා ඇම්පියර් 90 බැටරි 1 ක් මිලදී ගැනීමට අදාලව පවර් වීල් පුද්ගලික සමාගම වෙත 2022.08.04 දින සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු.54,500.00 ක මුදල, මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

පවර් වීල් පුද්ගලික සමාගම වෙත ගෙවන ලද රු 54,500.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.2.5 කර්මාන්ත අංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව LL-7533 කෘ කැබ් රථය සඳහා 650x16 ceat වර්ගයේ ටයර 2 ක් මිලදී ගැනීමට අදාලව ලාල් ටයර් පුද්.සමාගම වෙත 2022.08.08 දින සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු.76,600.00 ක මුදල, මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

ලාල් ටයර් පුද්.සමාගම වෙත ගෙවන ලද රු 76,600.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.2.6 ගබඩා අංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව 12.5/80r ටයර 2 ක් රු.206,000.00 ක මුදලකට , 900x20 ටයර 2 ක් 179,800.00 මුදලකට, 750x16 ටයර 6 ක් 317,400.00 ක මුදලකට ලබා ගැනීම වෙනුවෙන් ලාල් ටයර් පුද්.සමාගම වෙත 2022.09.06 දින සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු 703,200.00 ක මුදල, මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

ලාල් ටයර් පුද්.සමාගම වෙත ගෙවන ලද රු 703,200.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.2.7 ගබඩා අංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව 600/16 ටයර 4 ක් ලබා ගැනීම වෙනුවෙන් රත්න ටයර් පුද්.සමාගම වෙත 2022.09.06 දින සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු. 114,400.00 ක මුදල, මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රත්න ටයර් පුද්.සමාගම වෙත ගෙවන ලද රු 114,400.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.2.8 ගබඩා අංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව 12.4/11x 28 ටයර 2 ක් ලබා ගැනීම වෙනුවෙන් යූ එස් පී ටයර් ඇන්ඩ් ඔටෝ සෙන්ටර් වෙත 2022.09.06 දින සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු. 237,740.00 ක මුදල, මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

යූ එස් පී ටයර් ඇන්ඩ් ඔටෝ සෙන්ටර් වෙත ගෙවන ලද රු 237,740.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.2.9 සෞඛ්‍ය අංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව RF-2545 ට්‍රැක්ටරයේ බ්‍රේක් පද්ධතිය අලුත්වැඩියා කිරීමට අදාලව නිව් ඩයරින් මෝටර්ස් ,වලාන වෙත 2022.08.02 දින සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු.30,000.00 ක මුදල, මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

නිව් ඩයරින් මෝටර්ස් ,වලාන වෙත ගෙවන ලද රු 30,000.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.2.10 සෞඛ්‍ය අංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව LL-7533 කෘ කැබ් රථයේ ඔයිල් ෆිල්ටරයක් රු 6800.00 ක මුදලකට, ඩීසල් ෆිල්ටර ලොකු රු 6750.00 ක මුදලකට හා ඩීසල් ෆිල්ටර මීඩියම් රු 5900.00 ක මුදලකට ලබා ගැනීම වෙනුවෙන් සලාකා මෝටර්ස් වෙත 2022.08.04 දින සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු.19,450.00 ක මුදල, මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

සලාකා මෝටර්ස් වෙත ගෙවන ලද රු 19,450.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.2.11 සෞඛ්‍ය අංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව පහත අමතර කොටස් ලබා ගැනීම වෙනුවෙන් සලාකා මෝටර්ස් වෙත 2022.08.24 දින සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු.51,080.00 ක මුදල, මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

RB-2289	හයිඩ්‍රොලික් හෝස්	8900.00
RB-2289	හයිඩ්‍රොලික් කපිලින්ක් සෙට්	5780.00
RB-9564	ඔයිල් ෆිල්ටර් 1 , ඩීසල් ෆිල්ටර් 2	7250.00
RB-9564	ස්ප්‍රින් සෙට්	900.00
RF-2549	හිව් කොක්ක , මුදු කොක්ක	18650.00
RD-2778	හිව් කොක්ක , බෝල්ට් 2	9600.00

සලාකා මෝටර්ස් වෙත ගෙවන ලද රු 51,080.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.2.12 සභා යෝජනාවකට අනුව ගබඩා අංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව , පහත ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් කැල්ටෙක්ස් රෙජිනල් වෙයා හවුස් වෙත 2022.09.16 දින සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු. 469,045.00 ක මුදල, මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

එංජින් ඔයිල් ලීටර 210	259100.00
හයිඩ්‍රොලික් ඔයිල් ලීටර 60 (1707.75*60)	102465.00
ග්‍රීස් 32kg (3358.75*32)	107480.00
	469,045.00

කැල්ටෙක්ස් රෙජිනල් වෙයා හවුස් වෙත ගෙවන ලද රු 469,045.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.2.13 සෞඛ්‍ය අංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව , පහත අමතර කොටස් ලබා ගැනීම වෙනුවෙන් සලාකා මෝටර්ස් වෙත 2022.09.02 දින සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු.50,100.00 ක මුදල, මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

තණකොළ කපන යන්ත්‍ර 3 අලුත්වැඩියා කටයුතු		
පෙට්‍රල් ටියුබ් 3 (650*3)		1950.00
ස්පාර්ක් ප්ලග් 3 (790*3)		2370.00
ට්‍රයිමර් හෙඩ් 2 (1450*2)		2900.00
ස්ටාටර් කික් යුනිට්		1450.00
ඒ සී ඇසි		490.00
ක්‍රැන්ක් ඔයිල් සීල් 2 (325*2)		650.00
ගලි රථය	ඔයිල් ෆිල්ටර්	7950.00
	ඩීසල් ෆිල්ටර් L	5800.00
	ඩීසල් ෆිල්ටර් M	5750.00
RF-2549	හයිඩ්‍රොලික් හොස් 1	6950.00
RB-9564	පවර් ස්ටීරියර් රෙපෙයාර් කිට්	8690.00
RF-2545	ඔයිල් ෆිල්ටර් , ඩීසල් ෆිල්ටර් 2	5150.00
		50100.00

සලාකා මෝටර්ස් වෙත ගෙවන ලද රු 50,100.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.2.14 සෞඛ්‍ය අංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව පහත අමතර කොටස් ලබා ගැනීම වෙනුවෙන් සලාකා මෝටර්ස් වෙත 2022.09.20 දින සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු.54,890.00 ක මුදල, මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

RD-9458	හිව් හුක්	9950.00
කම්පැක්ටරය	ඔයිල් ෆිල්ටර්	7650.00
	ඩීසල් ෆිල්ටර්	7590.00
RB-7108	ටෙලර් හබ් බෝල්ට් (790*5)	3950.00
	ටෙලර් රේසර් ලොකු (6925*2)	13850.00
	ටෙලර් රේසර් පොඩි (5950*2)	11900.00
		54890.00

සලාකා මෝටර්ස් වෙත ගෙවන ලද රු 54,890.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.3 නගර සභා ප්‍රධාන පුස්තකාලය ඉදිරිපිට භූමිය වෙන්කිරීම් සිදු කිරීමේදී අයකළ යුතු විදුලි ගාස්තුව තීරණය කිරීමේදී ගැටළු මතුවන බැවින් එම ස්ථානයට වෙනම විදුලි මීටරයක් සවිකිරීමට කටයුතු කරන ලෙස මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.4 පාණදුර නගරයේ පෞද්ගලික බස්නැවතුම්පොළේ ඇති කඩ කාමරවලින් වරිපනම් බදු අයකිරීමට කටයුතු කළ යුතු බව ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටි අතර ඒ අනුව අදාළ කඩ කාමරවල අයිතිය ඇති නාගරික සංවර්ධන අධිකාරිය වෙත එම කඩ කාමරවලට අදාළව වරිපනම් බදු ගෙවන ලෙස දන්වා යැවීමට කටයුතු කරන ලෙස මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.5 නගර සභාවට අයත් එල්කඩ වලින් එල්කඩ කිහිපයක් පමණක් සභාව විසින් වාර්ෂිකව බදු දෙනු ලබයි. අනෙකුත් එල් කඩ වලින් හිඟ මුදල් ගෙවීමක් සිදුනොවන අතර මේ වන විට එම පිරිස ගිවිසුම්ද රහිතව අදාළ කඩ කාමරවල රැඳී සිටිනු ලබනවා.එමනිසා මෙම එල්කඩ කාමර සභාවට පවරා ගනිමින් ටෙන්ඩර් කිරීමට කටයුතු කරන ලෙස මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.6 වෙරළ තීරය වෙත පැමිණෙන ජනතාව වෙත බීමට ජලය ලබාගැනීමට තවත් ස්ථාන කිහිපයක ජල කරාම සවිකිරීමට කටයුතු කළ යුතු බව ගරු සභාපතිතුමා විසින් කමිටුව වෙත පවසා සිටි අතර ඒ අනුව ස්ථාන කිහිපයක ජල කරාම සවිකිරීමට කටයුතු කිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.7 එල් 05 කඩ කාමරය බදු ලබාගෙන සිටි බදුකරු විසින් 2022 වර්ෂයට අදාළ හිඟ බදු මුදල් වාරික වශයෙන් ගෙවීමට ඉල්ලීම් කර ඇති බැවින් 2023 වර්ෂයට නැවත ලංසු කැඳවීමට පෙර අදාළ හිඟ මුදල වාරික 03 කින් ගෙවීමට අවස්ථාව දීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.8 සභාවේ ආදායම් තත්ත්වය පහළ ගොස් ඇති බැවින් ආදායම් පරිපාලක මහතුන් විසින් හිඟ ආදායම්, ව්‍යාපාර බලපත්‍ර ලබාගැනීම් හා දැන්වීම් පුවරු මඟින් ලැබිය යුතු ආදායම් සභාව වෙත එකතු කර දීමේ කටයුතු නිසි අයුරින් ඉටු කරන ලෙස මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.එමෙන්ම හිඟ වරිපනම් බදු එකතු කිරීමේදී දෛනිකව හිඟ එකතු කරන්නාවූ දේපළ වල විස්තර ,දුරකථන අංක මේ වන විට ආදායම් පරීක්ෂක මහතුන් වෙත ලබාදී ඇති ආකෘති පත්‍රයට අනුව සකස් කර දෛනිකව ලබාදීමට කටයුතු කරන ලෙසද මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර2022.10.20 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු නිර්දේශ ,අනුමත කිරීමට තීරණය කරන ලදී.

(ඊ.2) ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා, ඉදිරිපත් කරන ලද යෝජනා

(ඊ.2.1) පට්ටිය උතුර ග්‍රාමසේවා වසමේ පෙරේරා මාවතේ කුලතුංග පාර ඉදිරිපිට සිට සමරනායක මහතාගේ කඩය අසල තෙක් වාහන ධාවනයේදී නිතර අනතුරට ලක්වන මෙතෙක් සංවර්ධනය නොවූ කාණු පද්ධතිය සංවර්ධනය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතරපට්ටිය උතුර ග්‍රාමසේවා වසමේ,පෙරේරා මාවතේ කුලතුංග පාර ඉදිරිපිට සිට සමරනායක මහතාගේ කඩය අසල තෙක් වාහන ධාවනයේදී නිතර අනතුරට ලක්වන මෙතෙක් සංවර්ධනය නොවූ කාණු පද්ධතිය සංවර්ධනය කිරීමට තීරණය කරන ලදී.

(ඊ.2.2) වර්ෂා අවස්ථාවලදී ජලය බැසයෑම අවහිරව පවතින සිලින්ඩර දමා නිමකර ඇති උසාවිය ඉදිරිපිට නිමල්කා උද්‍යානයට ඇතුලුවන ස්ථානයේ ඇති බෝක්කුව සංවර්ධනය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතරවර්ෂා අවස්ථාවලදී ජලය බැසයෑමට අවහිරව පවතින, සිලින්ඩර දමා නිමකර ඇති උසාවිය ඉදිරිපිට නිමල්කා උද්‍යානයට ඇතුලුවන ස්ථානයේ ඇති බෝක්කුව, සංවර්ධනය කිරීමට තීරණය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 2209/38 හා 2021.01.06 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද පාණ්දුර නගර සභා රැස්වීම් කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 19.8 වගන්තිය අනුව ඉදිරිපත් කරන ලද යෝජනා.

(ඊ.3) ගරු සභාපති නන්දන ගුණතිලක මැතිතුමා, ඉදිරිපත් කරන ලද යෝජනා

(ඊ.3.1) වර්ෂ ගණනාවක සිට අවසාන ගිණුම්වල පැවත එන හඳුනා නොගත් හිඟ සේවක ණය ශේෂය වන රු 521,639/= ක මුදල කපා හැරීම සඳහා විධිමත් කමිටුවක් පත් කර එම කමිටුවේ පරීක්ෂණ වාර්තාවද සමඟ 2019.08.01 මහා සභා වාරය සඳහා ඉදිරිපත් කළ අතර තීරණ අංක 5.1.13 යටතේ එම සේවක ණය ශේෂය කපා හැරීම සභා සම්මත විය.
අදාළ සභා තීරණයද,කමිටු වාර්තාවද සමඟ කපා හැරීම අනුමැතිය සඳහා කළුතර පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කරන ලදී.එම වාර්තාව පරීක්ෂා කිරීමෙන් පසු සංශෝධන කිහිපයක් ඇතුළත් විය යුතු බව දන්වා ඇත.ඒ අනුව නව කමිටුවක් පත් කර සකස් කරන ලද සංශෝධිත කමිටු වාර්තාව පිළිගැනීමට මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර වර්ෂ ගණනාවක සිට අවසාන ගිණුම්වල පැවත එන හඳුනා නොගත් හිඟ සේවක ණය ශේෂය වන රු 521,639/= ක මුදල කපා හැරීම සඳහා පත්කරන ලද නව කමිටුව විසින් ඉදිරිපත් කර ඇති සංශෝධිත කමිටු වාර්තාව ,අනුමත කිරීමට තීරණය කරන ලදී.

(උ) කාරක සභා වාර්තා පිළිබඳ සමාලෝචනය කිරීම -

(උ.1) 2022.10.07දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටුවාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(උ.2) 2022.10.13දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටුවාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා</u>

කසල අංගනයේ බෝතල් වැනි දේ ප්ලාස්ටික්,වීදුරු වශයෙන් වෙන්කිරීම සිදු කරනු ලබන්නේ එක් සේවක මහතෙකුගෙන්.එම කටයුත්ත නිසා තමයි මේවන විට එම බෝතල් විකිණීමෙන් ලැබෙන ආදායම වැඩි වී තිබෙන්නේ.මේ කටයුත්ත සඳහා තවත් සේවක මහතෙකු යොදවන ලෙසත් කසල අංගන පරිශ්‍රය සෑම දිනකම අතුගා පිරිසිදුව තබාගැනීමට එම සේවක මහතුන්ට උපදෙස් ලබාදෙන ලෙස පසුගිය කමිටු වාරයේ පවසා සිටියද ඒ කිසිදු දෙයක් මේවන තෙක් ඉටු වී නැහැ.තවද කසල අංගනයේ වාහන සේදීමට ප්‍රෙෂර්ගන් එකක් ලබාදීම සුදුසු බව පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

කමිටු වාරයන්හිදී හා සභා වාරයන්හිදී සහිකයින් විසින් නොයෙකුත් යෝජනා ඉදිරිපත් කළද මෙම යෝජනා වලින් බහුතරයක් ක්‍රියාත්මක කිරීමට නිළධාරීන් උනන්දුවන්නේ නැහැ.අවම වශයෙන් එම යෝජනා ක්‍රියාත්මක කිරීමට නොහැකි නම් ඒ සඳහා හේතු දැක්වීමක් හෝ ඊළඟ කමිටු වාරයේදී සිදුකරන්නේ නැහැ. මීට පෙර නල්ලූරුව සුසාන භූමිය නිසිකාල පරතරයක් තබාගෙන පිරිසිදු කරන්න කිවුවත් එය සිදුකරන්නෙම නැහැ.කාණු පිරිසිදු කිරීමත් යම් කාල සැලැස්මක් ඇතිව ඉටු කරන ලෙස දන්වා සිටියත් එය සිදුවන්නේම නැහැ.ගියවර කමිටුවේදී පවසා සිටියා වෙරළේ ඇති රථගාලට මුහුදු වැළි දමා බිම සකස් කරන ලෙස.නමුදු කිසිදු කෙනෙක් මේවන තෙක් එම කටයුත්ත පිළිබඳව සලකා බැලීමක් හෝ සිදුකර නැහැ.එමනිසා නිළධාරීන් මේවා පිළිබඳව දැඩි අවධානය යොමුකර මෙම අනුමත කර ඇති කාර්යයන් ඉටු කිරීමට කටයුතු කරන ලෙසත් ඉටු කළ නොහැකි නම් ඒ පිළිබඳවත් වාර්තා කරන ලෙසත් පවසා සිටින ලදී.

(උ.3) 2022.10.13 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටුවාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(උ.4) 2022.10.20 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(ඌ) සභාවේ ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය කිරීම -

(ඌ.1) 2022 සැප්තැම්බර් මස ලැබීම් ගෙවීම් වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(ඌ.2) 2022 සැප්තැම්බර්මස වරිපනම් අයකිරීම සම්බන්ධ මාසික ප්‍රගති වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(ඌ.3) 2022.09.30 දිනට හිඟ ආදායම් වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

අදහස් ප්‍රකාශ කරමින්:

ගරු සභාපතිතුමා

පසුගිය දිනක පැවති විගණන කළමනාකරණ කමිටුවේදී කළුතර දිස්ත්‍රික්කයේ සභාවන් වලින් අමතර ආදායම් ඉපැයීම යටතේ අප සභාව ඉදිරියෙන් සිටින බව පවසා සිටින ලදී. මෙම ආදායම තවදුරටත් වැඩි කිරීම සඳහා එම ස්ථානයන් වැඩිදියුණු කිරීමට කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා

වරිපනම් සම්බන්ධයෙන් ගත්විට අයකළ යුතු හිඟ වරිපනම් සැලකිය යුතු සංඛ්‍යාවක් පවතිනවා.එමනිසා එම ආදායම් එකතු කර ගැනීමට කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ආර්.බන්දුල සොයිසා මහතා

තාවකාලික කඩ කාමරවල මාසික කුලිය පිළිබඳව ගත්විට එම වෙළඳුන්ට සභාව වෙත පැමිණ ගාස්තු ගෙවීමට අපහසු බැවින් එම මුදල්, හිඟ මුදලක් වශයෙන් එකතු වෙනවා.එසේ එකතු වුවහොත් ඔවුන් එකවර නොගෙවා සිටීමට හැකි බැවින් අදාළ මුදල් එකතු කර ගැනීමට යම් වැඩපිළිවෙළක් යොදන ලෙස පවසා සිටින ලදී.

ගරු සභාපතිතුමා

මේවන විට ආකෘතියක් ලබාදෙමින් ආදායම් පරීක්ෂක මහතුන්ට හිඟ වරිපනම් ආදායම් එකතු කිරීමට වැඩපිළිවෙළක් සකස් කර ඇති අතර දේපළ තහනම වෙතද යොමු වන ලෙස උපදෙස් දී තිබෙනවා.

තාවකාලික කඩ කාමර සම්බන්ධයෙන් ගත්විට හිඟ කඩකුලී සැලකිය යුතු ප්‍රමාණයක් මිශ්‍ර ආදායම් අංශයේ නිළධාරිනියන් ගොස් එකතු කර ගැනීමට කටයුතු කළා.ඉදිරියේදී එම ස්ථානයේ සභාව විසින් තබාගත් කාමරයේ ආදායම් පරීක්ෂක මහතෙකු සතියකට වරක් හෝ රැදී සිටිමින් කඩ කුලිය එකතු කර ගැනීමට කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා

මෙම තාවකාලික කඩ කාමර වලින් ගිවිසුම් ගත වී ඇති කඩ කාමර මොනවාද ,කඩ කාමරවලින් අයවීමට ඇති හිඟ කඩ කුලී කොපමණද යන්න වාර්තාවක් මීළඟ මුදල් කමිටුව වෙත ලබාදෙන ලෙස පවසා සිටින ලදී.

(එ) අංශ ප්‍රගතිය සලකා බැලීම -

(එ.1) 2022 සැප්තැම්බර් මස ආදාහනාගාරයේ ආදායම් වියදම් වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.2) 2022.09.01 සිට 2022.09.30 දක්වා සභාව විසින් කසළ කළමනාකරණයේදී ,කසළ අවසන් බැහැර කිරීම පිළිබඳ වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.3) 2022 සැප්තැම්බර් මස නගර සභා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රගතිය

ගරු සභාවේ අවධානය යොමු විය.

අදහස් ප්‍රකාශ කරමින්:

ගරු සභාපතිතුමා

ආයුර්වේදය වෙත මේවන විට ජනතාව විශාල වශයෙන් පැමිණෙන අතර පැමිණෙන ජනතාවට රැදී සිටීමට වහලක් ලබාදෙන ලෙස ඉල්ලීම් ලැබී තිබෙනවා.මෙම කාර්යය ඉටු කර දිය යුතු අතරම එම ස්ථානයේ ,පෙර වෙන්කරන ලද කසල භාරගැනීමට පැවති ගොඩනැගිල්ලද ජනතාවට රැදී සිටීමට සුදුසු ආකාරයට සකස් කළ හැකි බැවින් එයද සකස් කළ දිය යුතු බව පවසා සිටින ලදී.

(එ.4) 2022 සැප්තැම්බර් මස පෙර පාසල් මාසික ප්‍රගතිය

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.5) 2022 ජූලි මස පුස්තකාල ප්‍රගතිය

ගරු සභාවේ අවධානය යොමු විය.

අදහස් ප්‍රකාශ කරමින්:

ගරු සභාපතිතුමා

පුස්තකාල සඳහා පොත් විශාල ප්‍රමාණයක් වලානේ ශ්‍රීමන්ත මහතා විසින් පරිත්‍යාග කළ අතර ඒ වෙනුවෙන් එතුමාට ස්තූතිවන්ත වන බව පවසා සිටින ලදී.

පුස්තකාලයේ දරුවන් පාඩම් කරන අංශයේ එක් එක් විෂයන්ට අදාල ආදාර්ශ, බිත්ති වල ප්‍රදර්ශනය කිරීමටත් එක් එක් විෂයන්ට අදාළ ගුරු මාර්ගෝපදේෂ,පසුගිය විභාග ප්‍රශ්ණපත්‍ර ආදිය කැබිනට්ටුවක දමා එම අංශයේ තබමින් පාඩම් කරන දරුවන්ට එම ස්ථානයෙන්ම පරිහරණය සඳහා ලබාගැනීමට අවස්ථාව ලබාදීමට වැඩසටහනක් සකස් කල යුතුයි කියා අදහසක් පවතිනවා.මන්ද පුස්තකාලයේ උපරිම ප්‍රයෝජනය ගන්නේ විභාග සඳහා පාඩම් කරන දරුවන්. මේ යෝජනාව ඉදිරි පුස්තකාල කමිටුවට යොමුකරන අතරම මේවන විට ඒ සඳහා මූලික වැඩකටයුතු ඉටු කරමින් පවතින බව පවසා සිටින ලදී.

(එ.6) 2022 අගෝස්තු මස පුස්තකාල ප්‍රගතිය

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.7) 2022 සැප්තැම්බර් මස පුස්තකාල ප්‍රගතිය

ගරු සභාවේ අවධානය යොමු විය.

(ඒ) වෙනත් කරුණු

(ඒ.1) ගරු සභාපතිතුමා

(ඒ.1.1) මෙන්ඩිස් මහතාගේ ආයතනයෙන් ගල්රෝල 2019 වර්ෂයේදී සභාවේ කටයුතු සඳහා ලබාගෙන තිබුණද මේවන තෙක් ඒ සඳහා ගෙවීම් සිදුකර නැහැ.සොයාබැලීම් කිරීමේදී පෙනී යන්නේ අදාළ යන්ත්‍රය වැඩ කළ පැය ගණන් පිළිබඳව සටහන් නොමැති බවයි.එය සභාවේ නොසැලකිල්ලක් බැවින් මෙම ගෙවීම පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් මීළඟ කර්මාන්ත කමිටුව වෙත යොමුකරන්න.එහිදී සාකච්ඡා කර මෙම බිල්පත ගෙවීමට කළ හැකි ඉදිරි කටයුතු සිදුකිරීමට කටයුතු කරමු යැයි පවසා සිටින ලදී.

(ඒ.2) <u>ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා</u>

(ඒ.2.1) සෞඛ්‍ය අංශයෙන් ආපනශාලාවලින් කසල ලබාගැනීම වෙනුවෙන් යම් මුදලක් සභාව වෙත ලබාගත් අතර එම ආදායම මේවන විට අවම මට්ටමෙන් සභාව වෙත ලැබෙන බවයි දැනගන්නට ලැබී ඇත්තේ.එමනිසා එම ආදායම් නිසි පරිදි ලබාගැනීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

මීළඟ සෞඛ්‍ය කමිටු රැස්වීම සඳහා සෞඛ්‍ය අංශයෙන් සභාව වෙත රැස්කර දෙන්නාවූ අතිරේක ආදායම් පිළිබඳ වාර්තාවක් ලබාදීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.2.2) මිනුවම්පිටිය සුසාන භූමියේ තණකොළ කැපීමට යන්ත්‍ර නොමැති බව එහි සිටින සේවකයින් විසින් පවසා සිටිනවා.මීට පෙර තණකොළ කපන යන්ත්‍ර 10 ක් මිලදී ගන්නා ලෙස අප කමිටු වලදී අනුමත කර තිබෙනවා.එමනිසා එම යන්ත්‍රවල යම් හිඟතාවයක් තිබෙනවා නම් මිලදී ගැනීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.2.3) මේවන විට ට්‍රැක්ටර් එන්ජින් 03 ක් අළුත්වැඩියාවට යොමුකර තිබෙන අතර 6996 දරණ ටිපර් රථයද අළුත්වැඩියාවට යොමු කර තිබෙනවා.ජෝන්ඩිය කොළපාට ට්‍රැක්ටරයත් අළුත්වැඩියා කිරීමට යොමුකර තිබෙනවා.මෙම වාහන මෙසේ තිබීමෙන් කසල කළමනාකරණ කටයුතු වලට බාධාවක් බැවින් මේවාට අවශ්‍ය අමතර කොටස් මිලදී ගනිමින් මෙම රථ කඩිනමින් අළුත්වැඩියා කිරීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී ලලීන් හසන්ත රුදිගෝ මහතා</u>

ජෝන්ඩිය ට්‍රැක්ටර් රථයේ ඇක්සල් එක අළුතින් දැමීමට සිදුවී තිබෙනවා.නමුදු එම අමතර කොටස් මේවන විට ලංකාවේ නැහැ.සුදුපාට ටිපර් රථය තවත් සති 02 කින් පමණ භාවිතයට ගත හැකියි. වාහන අළුත්වැඩියාවන් අඛණ්ඩව සිදුකරගෙන යනවා.නමුදු අමතර කොටස් නොමැති බැවින් යම් ගැටළුවකට මුහුණපා සිටින බව පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

මේවන විට සභාවේ වාහන වල තත්ත්වය පිළිබඳ වාර්තාවක් මීළඟ කර්මාන්ත කමිටුව වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.2.4) ආදායම් පරීක්ෂකවරුන් විසින් මේවන විට වරිපනම් සඳහා කේ පෝරම නිවෙස් වෙත ලබා දෙමින් යනවා.ඩයස් පෙදෙසේ සමහර ස්ථාන තිබෙනවා වරිපනම් නොගෙවන.එමනිසා ඒ පිළිබඳව එම පෝරම ගෙවන අවස්ථාවේදීම සටහන් තබාගනිමින් එම ස්ථානවලින්ද වරිපනම් ලබාගැනීමට කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා</u>

මෙවන් ගැටළුවක් වැකඩ සණස මාවතෙත් පවතින අතර ඒ පිළිබඳව සභාවේ අදහස් දැක්වීම්ද සිදුකර තිබෙනවා.මෙහිදී ආදායම් පරීක්ෂක මහතුන්ට ඒ ඒ කොට්ඨාශයන්හි ඡන්ද හිමි නාමලේඛණයේ පිටපතක් ලබාදීමට කටයුතු කරන්න.ඒ අනුව ඔවුන්ට පුළුවන් මහහැරී ඇති දේපළ හඳුනාගනිමින් වරිපනම් අයකිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු කරන්න යැයි පවසා සිටින ලදී.

(ඒ.2.5) නගර ශාලාව අසල බැනර් ප්‍රදර්ශණය සඳහා යකඩ වලින් කණුවක් සභාව විසින් සකස් කළද එය එම ස්ථානයේ ස්ථාපිත කිරීමට නොහැකි වුණා.මෙය දිරාපත් විය හැකි බැවින් එය කඩිනමින් ස්ථාපති කිරීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.2.6) නගර ශාලාව ඉදිරිපිට ඇති විලෝ ගස් හේතුවෙන් එම ශාලාව ඉදිරිපිට අඳුරු ස්වභාවයක් ගන්නවා.එමනිසා එම ගස් ඉවත් කර වෙනත් පැල වර්ගයක් සිටුවීමට කටයුතු කරමු යැයි පවසා සිටින ලදී.

(ඒ.2.7) සභාවට අයත් වෙරළේ ඉඩම වටා ඇති නිවසකින් එම ඉඩමට අනවසර ලෙස තාප්පයක් ඉදිකරමින් සිටින බැවින් මෙය ඉවත් කිරීමට කටයුතු කරන්න.එමෙන්ම මෙම ඉඩම අවට පදිංචිකරුවන් සභාව වෙත කැඳවමින් මෙම ඉඩම්වල මායිම් පිළිබඳව සාකච්ඡා කර අවසන් තීරණයකට එළඹිය යුතු බව පවසා සිටින ලදී.තවද එම රථගාලේ වාහන ගාල් කිරීමේදී එරීමට ලක්වන බැවින් පස් හෝ වැලි දමා එම ස්ථානය සකස් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.3) <u>ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා</u>

(ඒ.3.1) කොරෝනා සමයත් සමඟ ප්‍රධාන කාර්යාලයේ පරිහරණයට තැබූ පුවත්පත තැබීම සිදුකලේ නැහැ.නමුදු නැවතත් දෛනිකව පුවත්පතක් ,පුවත්පත් පුවරුව වෙත යොමු කරන්නේනම් සුදුසු බව පවසා සිටින ලදී.

(ඒ.3.2) මුහුදු වෙරළේ වීදි ලාම්පුවක් එල්ලෙමින් පවතින අතර එය අළුත්වැඩියා කිරීමට සභා සේවකයින්ට නොහැකි වී තිබෙනවා එම ස්ථානයේ කඩ ගසමින් අවහිරවී තිබීම නිසා.එමනිසා මේ පිළිබඳව අවධානය යොමු කර යම් පියවරක් ගන්නා ලෙස පවසා සිටින ලදී.

(ඒ.3.3) සුවමැදුර රෝහලේ වැසිකිළි වලවල් උතුරා කාණුවට ගලා බසින් බැවින් ඒ පිළිබඳව සොයා බලා විධිමත් පියවර ගන්නා ලෙස පවසා සිටින ලදී.

(ඒ.3.4)පිනෑන්ස්වත්ත ඉඩම මේවන විට යම් පුද්ගලයෙකු විසින් ගඩොල් තබමින් ව්‍යාපාරික කටයුත්තක් සඳහා යොදා ගනිමින් සිටිනවා.එමනිසා මෙම ඉඩම වට කර ඇතුළු වීමට නොහැකි ආකාරයෙන් සකස් කළ යුතු බව පවසා සිටින ලදී.

(ඒ.3.5) පසුගිය දිනක අප අතරින් වියෝවූ සභාවේ සේවය කළ කළමනාකරණ සේවා නිළධාරී චන්දිරා මාලනී මහත්මියට නිවන් සුව ප්‍රාර්ථනා කරන බව පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා</u>
සභාවේ සේවය කළ කළමනාකරණ සේවා නිළධාරී චන්දිරා මාලනී මහත්මියට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතරම සභාවේ සියළු දෙනා වෙනුවෙන් ඇයගේ ස්වාමි පුරුෂයා ඇතුළු පවුලේ සියළු දෙනා වෙත ශෝකය පලකරන බව පවසා සිටින ලදී.

(ඒ.4) <u>ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා</u>

(ඒ.4.1) වරිපනම් අංශයේ කවුන්ටරය ඉදිරිපිට පැවති ලී ආවරණයට අමතරව කොරෝනා සමයේදී තවත් ආවරණයක් සවිකරන ලදී.මේ හේතුවෙන් ජනතාව හා නිළධාරීන් අතර සන්නිවේදනයට බාධා සිදුවන අතරම ජනතාව මේ හේතුවෙන් සභාව වෙත බැණවදින අවස්ථාද පවතිනවා.එමනිසා මෙහි පවතින කවුළු විශාල කර හෝ මේ සඳහා කඩිනම් විසඳුමක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.4.2) සභාව සතුව පවතින ඉඩම් කිසිවෙකුට අනවසරයෙන් භාවිතා කිරීමට ඉඩ නොදිය යුතුයි.සාගර මාවතේ ඉඩම සභාව සතු ඉඩමක් ඒ පිළිබඳව මා හොඳින්ම දන්නාවූ කාරණාවක්.මා එම ප්‍රදේශයේ කුඩා කාලයේ සිටම ජීවත් වූ පුද්ගලයෙක්.මෙම ඉඩමේ ඉතිහාසය මා හොඳින්

දන්නවා.මෙම ඉඩමට අයිතිවාසිකම් කියන පුද්ගලයින් සතුව පවතින්නේ 2007 සිට පැවත එන ලියවිල්ලක්.එවිට ඊට පෙර මෙම ඉඩම එම ස්ථානයේ පැවතුනේ නැද්ද.එමනිසා මෙම ඉඩම පිළිබඳව නීතිමය කටයුතු වලට යොමුවන්න.ඕනෑම අවස්ථාවක එම නඩු කටයුතු සඳහා පෙනී සිටීමට තමා සූදානම් බව පවසා සිටින ලදී.එමෙන්ම මහජන පෙත්සම් කාරක සභාව තමා නියෝජනය නොකරන නමුදු මෙම කාරණය සම්බන්ධයෙන් සාකච්ඡා වන අවස්ථාවේදී පුරවැසියෙකු වශයෙන් හෝ කරුණු දැක්වීමට අවස්ථාව ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී කමල්සිරි ප්‍රනාන්දු මහතා</u>

මෙම ඉඩම මගේ සීයා, රුද්‍රිගෝ පවුලෙන් ලබාගත් ඉඩම් කොටසක්.නමුදු ඒ සඳහා ඔප්පුවක් නැහැ.එම ඉඩම් කොටස සභාවේ සිටි සභාපතිවරයෙකු වන නොයෙල් මෙන්ඩිස් මහතා විසින් සීයාගෙන් ඉල්ලා ගෙන තිබෙනවා සභාවට ,සීයට වෙනත් ඉඩම් කොටසක් ඒ වෙනුවට ලබාදෙන්නම් කියා.නමුදු මෙම ඉඩම සභාවට ලියා දීමට පෙර නොයෙල් මෙන්ඩිස් මහතා මියගොස් තිබෙනවා.සුනාමි පැමිණි අවස්ථාවේ මගේ මල්ලි ඇවිත් ඔය ස්ථානයේ පදිංචි වුණා.ඉන්පසු මල්ලි විසින් එය කාන්තාවකට විකුණු අතර එම කාන්තාවගෙන් ග්‍රාම නිළධාරීවරයෙකු නැවත මිලදී ගත්තා.2007 දී රුද්‍රිගෝ පවුලෙ අය පවසා තියෙනවා මල්ලිට ඔප්පුවක් ලබාදෙන්නම් කියා.නමුදු මල්ලි එය විකුණු නිසා ඔහුට ඒ සඳහා උවමනාවක් තිබී නොමැති අතර මල්ලිගෙන් මිලදී ගත් කාන්තාවද එය ලබාගැනීමට උනන්දු වී නැහැ.නමුදු ග්‍රාම නිළධාරීවරයා ප්‍රකාශණ ඔප්පුවක් ලියාගෙන තිබෙනවා.එය තමයි දැන් ඔය ඉදිරිපත් කරනු ලබන්නේ.ගරු උපසභාපතිතුමා ඉල්ලා සිටි පරිදිම මහජන පෙත්සම් කාරක සභාවේදී මෙම කාරණය සම්බන්ධයෙන් සාකච්ඡා වන අවස්ථාවේදී තමාටද කරුණු දැක්වීමට අවස්ථාව ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී ආර්.බන්දුල සොයිසා මහතා</u>

මාත් කුඩා කාලයේ පදිංචි වී සිටියේ සාගර මාවතේ.ඒ කාලයේ ඔය ඉඩම සහිත පෙදෙස දිගටම රැදී සිටියේ දෙමළ අය.ඔවුන් නොයෙකුත් කෑම හදමින් ජනතාවට ලබාදුන්නා.එමෙන්ම මෙම පුස්තකාලය පවතින ඉඩමෙහි පෙර පැවතියේ වැසිකිළි පද්ධතියක්.ඉන්පසු ඔය ස්ථානයේ පෙර පාසලක් හා පුස්තකාලයක් පැවති බව පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී එච්.වන්දිම ඒ.පීරිස් මහතා</u>

මහජන පෙත්සම් කාරක සභාවේදී මේ පිළිබඳව දීර්ඝව සාකච්ඡා කළා.ගරු නාගරික මන්ත්‍රී කමල්සිරි ප්‍රනාන්දු මහතා පවසා සිටි ආකාරයට නොයෙල් මෙන්ඩිස් මහතා විසින් මෙම ඉඩම සභාවට පවරා දීමට පෙර මියගිය බැවින් සභාව සතුවද පවරා දීම සම්බන්ධයෙන් ලියවිල්ලක් නොමැති අතර සභාවද අනෙක් පාර්ශවයද ඉදිරිපත් කරන්නේ භුක්තිය පිළිබඳවයි.ලේඛණ පරීක්ෂා කිරීමේදී 2007 සිට තොරතුරු පත්ඉරුවල පවතින අතර 2007 ට පෙර තොරතුරු නැහැ.නීතිඥවරුන්ද මේ පිළිබඳව සොයා බැලීම් කළ අතර 2007 ට පෙර තොරතුරු නොමැති බවයි දන්වා තිබෙන්නේ.නමුදු මේ පිළිබඳව තොරතුරු වෙනත් ආයතනවල හෝ පැරණි සභිකයින්ගෙන් සොයාගත හැකියි.එමනිසා මේ පිළිබඳව දීර්ඝ වශයෙන් ගැඹුරු විමර්ශණයක් සිදුකර සැලකිය යුතු බරක් දී කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

අද දින ඉදිරිපත් වුණු කරුණු අනුව මෙම ඉඩමේ පත්ඉරු වල සඳහන් වන්නේ 2007 සිට බැවින් ඊට පෙර තොරතුරු තවදුරටත් විමර්ශණය කළ යුතුයි.ඉඩම සම්බන්ධයෙන් අතීත තොරතුරු අද දින ඉදිරිපත් වූ බැවින් මේ පිළිබඳව වෙනම සාකච්ඡා කර සභාව ලෙස යම් එක් මතයකට පැමිණ අදාළ පාර්ශවයින් කැඳවා කරුණු ඉදිරිපත් කළ යුතු බව පවසා සිටින

ලදී.එමෙන්ම මහජන පෙත්සම් කාරක සභාවේ නොසිටියද නිරීක්ෂණ මට්ටමෙන් ඕනෑම සහිකයෙකුට සහභාගි විය හැකි බැවින් ගරු උපසභාපතිතුමාටත් ගරු නාගරික මන්ත්‍රී කමල්සිරි ප්‍රනාන්දු මහතාටත් මෙම කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා වන අවස්ථාවන්වලදී අදාළ කමිටුව වෙත සහභාගීවන ලෙස පවසා සිටින ලදී.

(ඒ.4.3) නගරයේ කාණු මේවන විට අවහිරවී දුහඳ හමන බැවින් මොරටුව මහනගර සභාවෙන් ලබාගත හැකි අධිපීඩන බවුසරය ගෙන්වා ගනිමින් මේවා පිරිසිදු කිරීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.5) <u>ගරු නාගරික මන්ත්‍රී ආර්.බන්දුල සොයිසා මහතා</u>

(ඒ.5.1) මෙදින වල ඇදහැළුනු වර්ෂාව හේතුවෙන් කාණු පද්ධති හිරවී නිවාස ජලයෙන් යටවීමට ලක්වුණා.මෙයට ප්‍රධාන හේතුව කාණු නිසි පළලින් යුක්ත නොවීමයි.යම් යම් ස්ථානවලින් පැවතිය යුතු පළලට වඩා අඩුවන ලෙස අවහිර කර තිබෙනවා.නල්ලූරුවේ ගලවැටිමෝදර කාණුවේ මෙම ගැටළුව පවතිනවා.එමනිසා මෙම කාණුවට පවතින අවහිරතා ඉවත් කර ජලය බැසයන ලෙස සකස් කළ යුතු බව පවසා සිටින ලදී.කවිරාජ මාවතෙත් මෙසේ කාණුව අවහිර කිරීමක් පවතින බව පවසන ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

මෙම ඇළ දෙපැත්තේ සිටින පිරිසව පෙත්සම් කාරක සභාව වෙත කැඳවමින් සාකච්ඡා කරමු.එහිදී සභාව සතු සැලැස්මවල් පෙන්වමින් එම අවහිරතා සිදුකර ඇති අයව දැනුවත් කළ හැකියි ඒවා නිවැරදි කරන ලෙස.එමනිසා මෙම ඇළදෙපසේ සිටින පිරිස මීළඟ පෙත්සම් කාරක සභාවට කැඳවීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.5.2) තාවකාලික වෙළඳ පොළෙහි මුරකරුවෙකු පසුගිය දිනවල සිටියේ නැහැ.එමනිසා ඒ පිළිබඳව සලකා බලන ලෙස ඉල්ලා සිටි අතර තාවකාලික කඩ කාමර අසළ ඇති පන්සල ඉදිරිපිට ඇති භූමිය ඉරිගසා අඟහරුවාදා හා සෙනසුරාදා දිනවල වෙළඳුන්ට සභාව යම් මුදලක් අයකරමින් ලබාදීම සුදුසුයි.මේවන විට වෙනත් පාර්ශවයන් එම භූමිය වෙළඳුන්ට ලබාදෙමින් මුදල් ඉපැයීමක් සිදුකරනවා.

<u>ගරු උපසභාපතිතුමා</u>

මෙම ස්ථානය පන්සල ඉදිරිපිට බැවින් පන්සලේ යම් වැඩසටහනක් සිදු කිරීමේදී ඉවත් වන ආකාරයෙන් කොන්දේසි යොදමින් ලබාදිය යුතු බව පවසා සිටින ලදී.

(ඒ.5.3) කොස්වේ කර්මාන්තශාලාව ඉදිරිපිට කාපට් පාරෙහි සැලකිය යුතු ප්‍රමාණයෙන් කොටු ආකාරයෙන් ස්ථාන දෙකක් කපා දමා තිබෙනවා.වර්ෂා අවස්ථාවලදී ජලයෙන් වැසී ගිය විට මෙම ස්ථාන දෙක නොපෙනෙන අතර මෙම ස්ථාන දෙක හේතුවෙන් වාහන අනතුරුද සිදු වෙනවා.එමනිසා මෙය සකස් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.6) <u>ගරු නාගරික මන්ත්‍රී ගයා උදයංගනී මිය</u>

(ඒ.6.1) අශෝක මාවතේ කාණු පද්ධතියක් සකස් කරන්න කියා යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා.පන්සලේ කයීන පිංකම පසුගිය දිනක පැවති අතර එහිදී පන්සලද වතුරෙන් පිරුණා. එම පාරේ නිවසක් පවතිනවා ජලයෙන් යටවන.එම නිවසට ආසන්න අනෙක් නිවස අනවසර

ලෙස තාප්පයක් බැඳ තිබෙනවා.කොතරම් කිව්වත් එය කඩා දමන්නෙ නැහැ.එමනිසා මේ පිළිබඳව සොයා බලා යම් පියවරක් ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.7) <u>ගරු නාගරික මන්ත්‍රී විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා</u>

(ඒ.7.1) බෝධිරුක්ඛාරාම පාරේ කාණුවට ස්ලැබ්දමා සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.මෙම මාර්ගයේ නොයෙකුත් අනතුරු සිදුවන බැවින් එම කාර්යය කඩිනමින් ඉටු කර දෙන ලෙස පවසා සිටින ලදී.එමෙන්ම මෙම මාර්ගයේ ඇති බෝගස කපා දැමීමේ කටයුතුද කඩිනමින් ඉටු කරන්න මන්ද එය කඩා වැටී යම් අනතුරක් සිදුවිය හැකි බව පවසා සිටින ලදී.

(ඒ.7.2) නල්ලූරුව සුසාන භූමිය බලා ගැනීමට පෙර සේවකයෙකු යොදවා සිටියද මේවන විට කිසිවෙකු නැහැ.එය කැලෑවක් බවට පත්වෙලා.එමෙන්ම මෙහි ගේට්ටුවද සකස් කළ යුතුයි.මන්ද දරුවන් බෝල ගසන බැවින් සොහොන් කොත් වලට හානි විය හැකියි යැයි පවසා සිටින ලදී.

(ඒ.8) <u>ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා</u>

(ඒ.8.1) මගේ කොට්ඨාශයේ උපාසිකාරමය ඉදිරිපිට ඉඩමක් පවතින අතර එය වෙන්දේසි කිරීමට සූදානම් බැවින් එම ඉඩමෙන් ලබාගන්නා බද්ද ලබාගෙන ඇත්ද යන්න මෙම සභාවේ කමිටු වාරයකදී විමසා සිටියා.ඒ පිළිබඳව සභාවේ නිළධාරීන් සොයා බැලීමක් සිදුකළාද යන්න විමසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

මේ සම්බන්ධයෙන් මේ අවස්ථාවේම විස්තර දැනගැනීම සඳහා අදාළ නිළධාරීන් සභාව වෙත කැඳවීම සුදුසු බව පවසා සිටින ලදී.

ප.ව.01.05 - **ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා විසින් ගරු සභාව , කාරක සභා අවස්ථාවට පත්විය යුතු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ලලීන් හසන්ත රුදිගෝ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව,කාරක සභා අවස්ථාවට පත්වන ලදී.**

ප.ව. 01.30 - **ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා විසින් කාරක සභාව ,ගරු සභා අවස්ථාවට පත්විය යුතු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව,ගරු සභා අවස්ථාවට පත්වන ලදී.**

<u>ගරු සභාපතිතුමා</u>

මෙම ඉඩම් කට්ටි කැඩීමේදී ඒ සඳහා වූ සැලැස්ම අනුමැතිය සඳහා සභාව වෙත ලැබිය යුතු අතරම පැවතිය යුතු අවම බිම් ප්‍රමාණයත් තිබිය යුතුයි.එය පැවතියහොත් තමයි සභාවට අදාළ බද්ද අයකර ගත හැක්කේ.කාරක සභා අවස්ථාවේ වැඩ අධිකාරීතුමා විසින් පැහැදිලි කළ පරිදි මෙම ඉඩමෙන් බද්ද අයකර ගැනීමට සුදුසු කොන්දේසි සපුරා ඇත්නම් ඒ සඳහා බද්ද ලබාගැනීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.8.2) හොරණ පාරේ ඩිපෝ එක ඉදිරිපිට ඇති කහඉර අවසන් වන ස්ථානයේ ස්ලැබ් කැල්ල දමා දෙන ලෙස ඉල්ලීම් කළ අතර එය මේවන විට ඉටු කර දී ඇති බැවින් ඒ සඳහා ස්තූතිවන්ත වන බවත් පුස්තකාලයේ වැසිකිළි පද්ධතිය මේවන විට සකසා ඇති බැවින් ඒ සඳහාද ස්තූතිවන්ත වන බව පවසා සිටින ලදී.

(ඒ.8.3) වැකඩ පෙර පාසලේ ඉහළ මහලේ අවසන් කටයුතු ,පුස්තකාලයේ වැසිකිළි පද්ධතිය සකස් කළ කොන්ත්‍රාත්කරු මඟින් හෝ අවසන් කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

(ඒ.8.4) වැකඩ කියවීම් ශාලාව ,පුස්තකාලයක් බවට පත්වීමේ කටයුතු සිදුනොවන්නේ පුස්තකාලයක් බවට පත්කිරීමට අවශ්‍ය පොත් 3000 සම්පූර්ණ කර ගැනීමට නොහැකි වීමයි.මේවන විට පොත් 2300 ගණනක් පවතින අතර ඉතිරි පොත් 700 සම්පූර්ණ කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

පොත් සැලකිය යුතු ගණනක් පරිත්‍යාගයක් වශයෙන් ලැබී ඇති අතර එය වැකඩ පුස්තකාලයට ලබාදීමට කටයුතු කළ හැකි බව පවසා සිටින ලදී.

(ඒ.8.5) ජනඋදාන ගම්මානයේ වැසියන්ට ඔප්පු ලබාදීමේ කටයුත්තේදී දැන් ඒ සම්බන්ධයෙන් කළුතර සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් නිර්දේශ ඉල්ලා තිබෙනවා.ඒ සඳහා කළුතර විමර්ශණ නිළධාරීන් සභාවට පැමිණ තොරතුරු රැස්කරනවා.එමනිසා එම කටයුත්ත පිළිබඳ සොයා බලා ඉටු කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.8.6) වැකඩ ක්‍රීඩා පිටියෙහි ඇති ගල් ඉවත් කිරීමට කටයුතු කළ අතර ඒ සඳහා ස්තූතිවන්ත වන අතරම එම ක්‍රීඩා පිටිය වටා ඇති කම්බි වැට සකස් කර මෙහි දිවා රාත්‍රී ක්‍රීඩා කළ හැකි වොලිබෝල් පිටියක් සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.8.7) ගියවර සභා වාර්තාවේ ඇති කර්මාන්ත කමිටු වාර්තාවේ කරුණක් වශයෙන් සඳහන් ආනන්ද ජයරත්න හා තමරා පුෂ්පිකා යන අයවිසින් නගර සභාව විසින් කාණුවක් කැපීමට විරුද්ධව නඩුවක් ගොනුකළ අතර එහිදී උසාවියෙන් සභාවට පක්ෂව තීන්දුවක් ලබාදුන්නා.නැවත මෙම දෙපල විසින් අභියාචනාධිකරණය ,අභියාචනයක් ඉදිරිපත් කර ඇති බැවින් මෙම කාණුව සම්බන්ධ නඩු කටයුතු වලදී කොපමණ මුදලක් සභාව විසින් දරා ඇත්ද යන්න දැනගත යුතු බව පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

මේ සම්බන්ධ වාර්තාවක් මීළඟ කර්මාන්ත කමිටුව වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.8.8) පිහිණුම් තටාකය සම්බන්ධයෙන් සාකච්ඡාවක් ඊයේ දින පැවති අතර ඒ සඳහා සහභාගී වීමට නොහැකි වුණා.එම සාකච්ඡා සම්බන්ධයෙන් විස්තර දැනගත හැකිද යන්න විමසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

මෙම සාකච්ඡාව සඳහා පිහිණුකරුවන් තුන්දෙනෙකුද දෙමාපියන් නියෝජනයක්ද සිදුවී තිබෙනවා.එහිදී යම් නිර්දේශයන් මෙන්ම යම් යම් දේ ඉල්ලීම්ද කර තිබෙනවා.එහි ප්‍රධාන වශයෙන් තිබෙනවා ගඟේ කිඹුලෙකු සිටින බැවින් පිහිණීම සඳහා එන දරුවන් ගඟ අයිනට යන බැවින් එම ගඟ අයින දිගේ වැටක් ගසා දෙන ලෙස කරන ලද ඉල්ලීම.මේ සම්බන්ධයෙන් ඇත්ත වශයෙන්ම අවධානය යොමු කළ යුතු අතර හඩිසන් උද්‍යානයටත් පිහිණුම් තටාකයටත් ගඟ දෙසින් ආවරණයක් සකස් කිරීමට කඩිනමින් ඇස්තමේන්තු සකස් කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.8.9) විදුලි අංශයේ කොටසකට පමණයි වැහිකබා ලබාදී තිබෙන්නේ.එමනිසා අනෙක් අයටත් වැහිකබා ලබාදීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.9) <u>ගරු නාගරික මන්ත්‍රී ලලීන් හසන්ත රුදිගෝ මහතා</u>

(ඒ.9.1) පාණදුර කර්මාන්ත පුරයේ කොරියන් ස්පා ආයතනයෙන් ඉල්ලීමක් කර තිබෙනවා,සවස එම මාර්ගයේ දරුවන් බයිසිකල් මඟින් වීල් කරන බැවින් එම මාර්ගයට මාර්ග වැටි දැමිය හැකිද කියා.එහිදී මා පවසා සිටියා මාර්ග වැටි දැමිය නොහැකියි පාරේ කුඩා හතරැස් කොටු ළකුණු කරමින් මාර්ග බාධක දැමිය හැකි බව.එම ආයතනය මේ සඳහා වන වියදම්ද දැරීමට සූදානම් බැවින් ඒ සඳහා හැකියාවක් ඇත්නම් සභාවේ අවසරය ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.9.2) ජයි ජයි බීච් හෝටලය ඉදිරිපිට ඇති උයන්කැලේ පාරෙන් ගොස් කළුතර දෙසට ඇති පිරිසිදු කළ ඉඩම හරියේ ඇති පටු කාණුවට හැකියාවක් ඇත්නම් ස්ලැබ් දමා සකස් කර දෙන ලෙස ඉල්ලීම් ලැබී ඇති බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.10) <u>ගරු නාගරික මන්ත්‍රී එච්.වන්දිම ඒ.පීරිස් මහතා</u>

(ඒ.10.1) නගර සභාවේ ලේඛණාගාරයේ සේවය කළ කළමනාකරණ සේවා නිළධාරිනී චන්දිරා මාලනී මහත්මියගේ හදිසි වියෝවය පිළිබඳව අපගේ ශෝකයත් මෙම සභාවේ ශෝකයත් පක්ෂයේ ශෝකයත් ඇයගේ ස්වාමිපුරුෂයා ඇතුළු පවුලේ සියළු දෙනා වෙත පළකරන බව පවසා සිටින ලදී.

(ඒ.10.2) ආදායම් පරීක්ෂක මහතුන් කිහිප දෙනෙකුම පවසා සිටියා උඩහමුල්ල සමන් මාවත පුවරුව සවිකර දෙන ලෙස කාලයක් තිස්සේ කර ඇති ඉල්ලීම සලකා බලා නොමැති බැවින් ඊයේ දින ප්‍රදේශවාසීන් විසින් පැමිණ බැනවැදී ගොස් තිබෙනවා කියා.එමනිසා ඒ පිළිබඳව වැඩ අධිකාරීතුමා මැදිහත් වී එම පුවරුව සවිකිරීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.10.3) මෙවන විට සභාව මැදිහත් වී ක්‍රීඩාංගනය අවට ඇති ගස් කපනවාද යන්න විමසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

ක්‍රිකට් පුහුණු වීම් කරන ස්ථානයේ ඇති අන්දර ගස්වලින් එම පුහුණු වීම් කරන ස්ථානයට කොළ වැටීම නිසා එම පිටියට හානි වන බැවින් එම අන්දර ගස් ඉවත් කරන ලෙස ඉල්ලීම් ලැබී තිබෙනවා,එමනිසා එම ගස්ද අනෙකුත් ගස්වල දිරාගිය අතු කැපීමක්ද සිදු කරනවා.මෙම ගස් කපන්නේද එම ස්ථානවල වෙනත් ගස් සිටුවීමේ අදහස ඇතිව බව පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා</u>

මෙම ක්‍රීඩාංගණය අවට ඇති ගස්වල අතු දිරාගොස් කඩා වැටී වාහන වලටද හානිවූ අවස්ථා පවතිනවා.එමෙන්ම එම ස්ථානයේ ඇති එක් ගසක කඳෙහි විශාල බෙනයක් පවතින බැවින් එයද යම් කිසි අවස්ථාවක කඩා වැටිය හැකියි.එමනිසයි යම් අනතුරක් වීමට පෙර මෙසේ ගස් කැපීමට හා අතු කැපීමට යොමු වුණේ යැයි පවසා සිටින ලදී.

(ඒ.10.4) පාණදුර මහාමාත්‍ය විද්‍යාලයේ සිදුවූ ගැටළුවත් සමඟ අප කතා නොකළාට පාණදුරේ තිබෙන එක් ගැටළුවක් තමයි මේ තැන තැන ටයර් පිළිස්සීම.සුසන්ත මාවතේ එක් ස්ථානයක පාර

අයිනේද ටයර් පිළිස්සීමට ලක්කර තිබෙනවා.නොයෙල් මෙන්ඩිස් මාවතෙත් එක්වරක් රසායනික ද්‍රව්‍ය පිළිස්සීමට ලක්කලා.නගරයක් ලෙස ගත්විට මෙසේ තැන තැන කුණු පිච්චිය නොහැකියි.නගරයේ වායුව කොහොමත් දූෂණය වී තිබෙන අතර මෙවන් දුමක් ආවිට තවත් වායුව දූෂණය වීමට ලක්වෙනවා.මෙයින් නගරවැසියන්ගේ ශ්වසනය සම්බන්ධයෙන් බරපතල ගැටළුවක් මතුවෙනවා.එමනිසා නගරය මැද කොටසට වත් මේසම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමට හෝ නීතිය ක්‍රියාත්මක කිරීමට සභාව යම් මැදිහත් වීමක් සිදුකිරීම සුදුසු බව පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

පාසලේ සිද්ධියේදී මහජන පීඩා පනත යටතේ පොලීසිය මැදිහත් වී හතර දෙනෙකු අත්අඩංගුවට ගෙන තිබෙනවා.මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ටත් ඒ ඔස්සේ කටයුතු කළ හැකියි.මෙවන් දේ කළවිට දඬුවම් ලැබිය හැකි බවට වන පණිවිඩය ජනතාව වෙත ලබාදීමට මෙය සිදුකළ පුද්ගලයින්ට නීතියෙන් දඬුවම් දීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සහයද පොලීසිය වෙත ලබාදෙන ලෙස පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ</u>

එදින පාසලේ ඇති වූ සිද්ධිය අවස්ථාවේදී සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක සඳරුවන් මහතා ඇතුළු සේවකයින් මැදිහත් වී කඩිනමින් අවශ්‍ය කටයුතු ඉටු කළා.සභිකයින් කිහිපදෙනෙකුත් ඒ අවස්ථාවේදීම එතැනට සහභාගී වුණා.මෙහිදී පුළුස්සා ඇත්තේ වයර් වර්ගයක් යැයි පවසා සිටින ලදී.

(ඒ.10.4) මහාමාත්‍ය විද්‍යාලයේ එදින එම හදිසි අවස්ථාවේදී මාර්ගයේ ඇති වලවල් හේතුවෙන් වාහන ගමනාගමනයට යම් බාධා පැමිණි හෙයින් එම මාර්ගයද ප්‍රිමික්ස් යොදා සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.11) <u>ගරු නාගරික මන්ත්‍රී පුෂ්පා ෆොන්සේකා මිය</u>

(ඒ.11.1) ෆොන්සේකා පාරේ සීලවතී ආරාමය අසල මාර්ග කොටස අළුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලා සිටියත් මේවන තෙක් එය ඉටු කර නොමැති බැවින් එම මාර්ගය අළුත්වැඩියා කරදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

2022.11.03 වන දින මහා සභා න්‍යාය පත්‍රයට අනුව නියමිත කරුණු එපමණක් වූයෙන් අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය දුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලයට තම ස්තූතිය පුද කරමින් 2022 නොවැම්බර් මස 03 වන දින මහා සභාවේ වැඩ කටයුතු ප.ව. 03.15 නිමාවට පත් විය.

සභාපති,
නගර සභාව,
පාණදුර.
24/11/22

ඇම්.ඩී. නන්දන ගුණතිලක
සභාපති
පානදුර නගර සභාව

ලේකම්
නගර සභාව,
පාණදුර
2022-11.23

ටී. මානෙල් සියඹලාගොඩ
ලේකම්
පානදුර නගර සභාව